# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,501—1965 සැප්තැම්බර් 9 වැනි බ්‍රහස්පතින්දා—1965.9.9**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# IV වැනි කොටස—පළාත් පාලනය

**(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගවකට, වෙන වෙනම පිටු අංක යොදා ඇත.)**


| | පිට | | පිට |
|---|---|---|---|
| **පළාත් පාලන නිවේදන** | 659 | **ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන** | 677 |
| **කනතුරු—ඇබෑර්තු** | 672 | **අය–වැය ලේඛන** | 680 |
| **විභාග, විභාග ප්‍රතිඵල ආදිය** | — | **දේපළ විකිණීම** | — |
| **අතුරු ව්‍යවස්ථා** | 676 | **මාර්ග කොමිටි දැන්වීම** | — |
| **පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම** | 677 | **විවිධ දැන්වීම** | 682 |


## පළාත් පාලන නිවේදන

ඇල්. ඩී.—බී. 9/64 (23)
ප. පා. දෙ.—ජී. ජේ. 10/1/10.

### ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත

(262 වෙනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමැතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමැති.

1965 අගෝස්තු 31 දින,
කොළඹ දී ය.

**ආඥාව**

(262 වෙනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තිය යටතේ සම්පාදිතව, 1964 ජූනි 22 වැනි දින අංක 14,073 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද, රත්නපුර දිස්ත්‍රික්කයේ නිවිතිගල හා මාරපන යන ගම් ප්‍රදේශයන්ට අදාළ ආඥාව මෙහි පහත දැක්වෙන අන්දමට මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එහි (1) වැනි ඡේදයෙහි "1965 ජනවාරි මස 31 වැනි දින" යන යෙදුම වෙනුවට "1966 ජනවාරි මස 31 වැනි දින" යන යෙදුම ආදේශ කිරීමෙන් ; හා

(ආ) එහි (2) වැනි ඡේදයෙහි "1965 පෙබරවාරි මස පළමුවැනි දින" යන යෙදුම වෙනුවට "1966 පෙබරවාරි මස පළමුවැනි දින" යන යෙදුම ආදේශ කිරීමෙන්.

9–512/1—65.9.9 දින අංක 14,501 දරන ගැසට් සකය

ඇල්. ඩී.—බී. 9/64 (23)
ප. පා. දෙ.—ජී. ජේ. 10/1/10.

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5(1) වැනි වගන්තියෙන් හා (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමැතිවරයා විසින් පනවන ලද ආඥාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමැති.

1965 අගෝස්තු 31 දින,
කොළඹ දී ය.

**ආඥාව**

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5(1) වැනි වගන්තිය හා (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තිය යටතේ සම්පාදිතව, 1964 ජූනි මස 22 වැනි දින අංක 14,073 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද, රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ නවදුන් කෝරළේ මැදපත්තු ගම් ප්‍රදේශය නැවත බෙදා වෙන් කිරීමට අදාළ ආඥාව, එහි 2 (ආ) ඡේදයෙහි සඳහන් "1965 පෙබරවාරි මස පළමුවැනි දිනය" යන යෙදුම වෙනුවට "1966 පෙබරවාරි මස පළමුවැනි දිනය" යන යෙදුම ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

9–512/2—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

ඇල්. ඞී.—බී. 9/64 (23)
ප. පා. දෙ.—ජී. ජේ. 10/1/10.

## ගම් සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම, 1964 සැප්තැම්බර් මස 30 වැනි දින අංක 14,185 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ වූ නිවේදනයෙන් සංශෝධිත, 1964 ජූනි මස 22 වැනි දින අංක 14,073 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ නිවිතිගල සහ මාරපන යන ගම් ප්‍රදේශ වල පිහිටි ග්‍රාම සේවක කොට්ඨාශවල ඡන්ද කොට්ඨාශ නැවත බෙදා වෙන් කිරීමට අදාළ නිවේදනය, එහි (3) (අ) ඡේදයෙහි සඳහන් "1965 ජනවාරි මස 31 වැනි දින" යන යෙදුම වෙනුවට "1966 ජනවාරි මස 31 වැනි දින" යන යෙදුම ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරමි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමැති.

1965 අගෝස්තු 31 දින,
කොළඹ දී ය.

9-512/3—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

එල්. ඩී.—බී. 9/64 (4)
ප.පා.දෙ.—ජී.ඊ.10/1/14/1

## ගම් සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 5(2) වැනි වගන්තියෙන් තමා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් පනවන ලද ආඥාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරලේ ප්‍රාදේශීය ආදයම් නිලධරයාගේ කොට්ඨාශයට අයත් යටිගහ ගම් ප්‍රදේශය නැවත බෙද වෙන් කිරීමට අදළව පනවනු ලැබ 1964 ජූලි මස 10 වැනි දින අංක 14,102 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද ආඥාවේ සඳහන් බෙද වෙන් කිරීම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරුණු සඳහා මෙහි වූ උපලේඛනයේ දක්වෙන ආකාරයෙන් මෙයින් විධිවිධාන සලස්වනු ලැබේ.

### උපලේඛනය

එක් එක් අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව, එකී අළුත් ගම් ප්‍රදේශයට අදල විය හැකි ගම් සභා ආඥාපනතේ සියළු ම කාර්යයන් සඳහා, පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතු ය.

2. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව 1965 ජනවාරි මස 31 වන දින දී වලංගු ව පවත්නා සියළු ම අතුරු ව්‍යවස්ථා, එකී එක් එක් අළුත් ගම් ප්‍රදේශයට ඒවා අදළ වන ප්‍රමාණයට, එක් එක් අළුත් ගම් ප්‍රදේශයේ වලංගු ව පැවතිය යුතු අතර එකී අතුරු ව්‍යවස්ථා එකී අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිත ලෙස සැලකිය යුතු ය.

3. 1965 ජනවාරි මස 31 වන දිනදී පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින පහත සඳහන් චංචල දේපළ 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට පල්ලෙවෙල අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පවරන ලද ලෙස සැලකිය යුතු අතර පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ ඉතිරි චංචල දේපළ කොටදෙනියාව අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පැවරිය යුතු ය :—

| | |
|---|---|
| අල්මාරි | 1 |
| නාරාසන | 1 |
| පොරෝ | 1 |
| ගල්කටු | 5 |
| තීන්ත උරවන පෑඩ | 2 |
| දිග බංකු | 1 |
| අත් පුටු | 3 |
| සාමාන්‍ය පුටු | 13 |
| කුණු කසල කරත්ත | 4 |
| බිත්ති ඔර්ලෝසු | 1 |
| මුදල් පෙට්ටි | 1 |
| රෑලේ බයිසිකල් | 1 |
| පිටපත් යන්ත්‍ර | 1 |
| පයිල් කැබිනට් | 1 |
| පිල්ටර් | 1 |
| තුවක්කු | 1 |
| මිටි | 1 |
| පුනීල | 1 |
| ස්ප්‍රේ යන්ත්‍ර | 1 |
| කැති | 1 |
| ලන්තෑරුම් | 1 |
| සිතියම් (යටිගහ) | 1 |
| උදලු | 30 |
| ඇන ගලවන උපකරන | 1 |
| කඩදසි අමුනන ක්ලිප් | 5 |
| වීදුරු බෝල | 5 |
| කඩදසි විදින යන්ත්‍ර | 1 |
| ඉබි | 6 |
| පෑන් | 2 |
| රාක්ක | 1 |
| රේක්ක | 3 |
| රූල් පොලු (18") | 2 |
| වැහි කබා | 1 |
| තීන්ත පෑඩ | 1 |
| තීන්ත භාජන | 3 |
| වැට කපන කතුරු | 1 |
| තණකොළ කපන කතුරු | 1 |
| අත් කියත් | 1 |
| ඉස්කුරුප්පු නියන් | 1 |
| ටෙන්ඩර් පෙට්ටි | 1 |
| ලියන මේස | 1 |
| සෘමාන්‍ය මේස | 4 |
| ඉංග්‍රීසි ටයිප්රයිටර් | 1 |
| සිංහල ටයිප් රයිටර් | 1 |
| ලිපි බන්දේසි | 5 |
| මිනුම් ටේප් | 1 |
| ටයිප් රයිටර් මේස | 1 |
| ටයිප් රයිටර් බංකු | 1 |
| සාක්කු ඔර්ලෝසු | 1 |
| වීල් බැරෝ | 2 |
| කඩදසි අමුණන යන්ත්‍ර | 1 |
| රබර් සීල් ස්ටෑන්ඩ | 1 |
| පිහියා | 1 |

පල්ලෙවෙල ගම් ප්‍රදේශයට අසුවන මුද්දරගම සහ කල්එලිය මාතෘ දරකාභිවෘද්ධි චිකිත්සාගාරවල ඇති සියළු ම චංචල දේපළ එම ගම් ප්‍රදේශය කෙරෙහි පැවරිය යුතු ය.

හෙට්ටිමුල්ල මාතෘදරකාභිවෘද්ධි චිකිත්සාගාරයේ ඇති සියළු ම චංචල දේපළ කොටදෙනියාව ගම් ප්‍රදේශය කෙරෙහි පැවරිය යුතු ය.

4. 1965 ජනවාරි මස 31 වන දින පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පැවරී තිබෙන හෝ එහි පාලනය යටතේ පවතින එක් එක් ඉඩම ගොඩනැගිල්ල හෝ වෙනත් නිශ්චල දේපළ 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට එකී ඉඩම ගොඩනැගිල්ල හෝ වෙනත් නිශ්චල දේපළ පිහිටි අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පැවරී ඇති ලෙස සැලකිය යුතු යි.

5. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ සියළු ම අයිතිවාසිකම්, ණය තුරුස්, බැරකම් හා බැඳීම්, ඒවා එක් එක් අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභා වලට අදල වන ප්‍රමාණයට, 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට එකී අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවට මාරු කරණු ලැබූ ලෙස සැලකිය යුතු ය.

6. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභා කාර්යාලයේ පවත්වාගෙන යනු ලැබූ සියළුම ලිපි ගොනු හා ලේඛණ, ඒවා එක් එක් අළුත් ගම් ප්‍රදේශයට අදළ වන ප්‍රමාණයට, 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට එකී අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභා කාර්යාලයට මාරු කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

7. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ සේවයේ නියුක්තව සිටි හා දනට නියුක්තව සිටින සේවකයන්ට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස වූ දයක මුදල් ගෙවීම පිළිබඳ බැරකම් පහත සඳහන් ආකාරයට බෙදිය යුතුය :—

(අ) පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් දනට ගෙවනු ලබන විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් පල්ලෙවෙල සහ කොටදෙනියාව අළුත් ගම් සභා අතර 1 : 1 අනුපාතයෙන්,

(ආ) පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ කලින් සේවය කොට දනට පිටතට මාරු කර ඇති සේවකයින්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් පල්ලෙවෙල සහ කොටදෙනියාව අළුත් ගම් සභා අතර 1 : 1 අනුපාතයෙන්,

(ඇ) පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ දනට සේවයේ නියුක්තව සිටින සේවකයින්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් පල්ලෙවෙල හා කොටදෙනියාව අළුත් ගම් සභා අතර 1 : 1 අනුපාතයෙන්.

8. 1965 ජනවාරි මස 31 වැනි දින යටිගහ පැරණි ගම් සභාවේ බැරට තිබෙන ශුද්ධ පොදු අර මුදල පහත දක්වා ඇති ප්‍රමාණයෙන් 1965 පෙබරවාරි මස 1 වැනි දින අළුත් ගම් සභාවල පොදු අරමුදල්වලට බැර කළ යුතු ය :—

හරි අඩක් පල්ලෙවෙල ගම් සභාවට,

හරි අඩක් කොටදෙනියාව ගම් සභාවට.

9. මෙම උපලේඛනයේ—

(අ) අන් ලෙසකින් නිශ්චිත ව සඳහන් කරනු ලැබුව හොත් මිස, "අළුත් ගම් ප්‍රදේශය" යන්නෙන් 1964 ජූලි මස 10 වන දින අංක 14,102 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවෙහි වූ උපලේඛනයෙහි විස්තර කර ඇති පල්ලෙවෙල සහ කොටදෙනියාව ගම් ප්‍රදේශ අදහස් වේ.

(ආ) "පැරණි ගම් ප්‍රදේශය" යන්නෙන් අළුත් ගම් ප්‍රදේශය ඇතිවීමට පෙර පැවති යටිගහ ගම් සභාවේ ගම් ප්‍රදේශය අදහස් වේ.

9–506—65.9.9 දින අංක 14.501 දරණ ගැසට් පත්‍රය

---

ඇල්.ඞී.—ඕ. 9/64 (11)
ප. පා. දේ.—ජී.ඒ. 10/1/2.

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත පරිදි (257 අධිකාරය වන) ගම් සභා ආඥා පනතේ 5 (2) වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලනය පිළිබඳ ඇමති විසින් පනවන ආඥාව.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලනය පිළිබඳ ඇමති.

1965 අගෝස්තු මස 25 වන දින,
කොළඹ දීය.

### ආඥාව

1964 ජූනි මස 27 දින අංක 14,083 දරන ගැසට් පත්‍රයේ සඳහන් බදුල්ල දිස්ත්‍රික්කයේ යටිකිඳ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ රඹුක්පොත නමින් අලුත් ගම් සභාවක් ඇතිකිරීම හා රිල්පොල ගම් ප්‍රදේශය වෙනස් කිරීම හා නැවත විස්තර කිරීම ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය කරුණු සඳහා මීට යාකොට ඇති උප ලේඛනයේ දක්වා ඇති පරිද්දෙන් මෙයින් විධිවිධාන සලස්වනු ලැබේ.

### උපලේඛනය

1. අලුත් ගම් ප්‍රදේශයට අදාල ගම් සභා ආඥා පනතේ සියලු කාර්‍යයන් සඳහා රඹුක්පොත හා රිල්පොල එක් එක් අලුත් ගම් ප්‍රදේශවල ගම් සභා, පැරණි රිල්පොල ගම් ප්‍රදේශයේ ගම්සභාවේ අනුප්‍රාප්තික ගම් සභාවක් වශයෙන් සැළකිය යුතුය.

2. රිල්පොල පැරණි ගම් ප්‍රදේශයෙන් ගම් සභාව විසින් සම්පාදිතව 1965 ජනවාරි මස 31 වැනි දින වලංගුව පවත්නා සියලුම අතුරු ව්‍යවස්ථා, එකී අලුත් ගම් ප්‍රදේශයට අදාල ප්‍රමාණයට එකී එක් එක් අලුත් ගම් ප්‍රදේශය තුළ වලංගුව පැවතිය යුතුවාත් හැර එකී අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් එම අතුරු ව්‍යවස්ථා සම්පාදිත ලෙසද සැළකිය යුතුය.

3. 1965 ජනවාරි මස 31 වැනි දින පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ පොදු අරමුදලට බැරකරනු ලැබූ මුදල් ප්‍රමාණයෙන් අඩක් 1965 පෙබරවාරි මස 1 වැනි දිනදී අලුත් එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවේ පොදු අරමුදලට බැරකළ යුතුය.

4. 1965 ජනවාරි මස 31 වැනි දින රිල්පොල පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත පැවරී ඇති හෝ එහි පාලනය යටතේ ඇති එක් එක් ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපල 1965 පෙබරවාරි මස 1 වැනි දිනදී එම ඉඩම, දේපල හෝ වෙනත් නිශ්චල දේපල පිහිටියාවූ ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත පැවරී ඇති ලෙස සැලකිය යුතුය.

5. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ අයිතිවාසිකම්, ණයතුරුස්, බැරකම් හා බැඳීම් සියල්ලක්ම එක් එක් අලුත් ගම් ප්‍රදේශයකට අදාළවන තාක් 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට එකී අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවට මාරුකරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

6. 1965 ජනවාරි 31 වැනි දින පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභා කාර්‍යාලයේ පවත්වාගෙන යනු ලැබූ සියලු ලිපිගොනු හා ලේඛන එක් එක් අලුත් ගම් ප්‍රදේශයකට අදාළ වන තාක් 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට එකී අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභා කාර්යාලයට මාරුකරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

7. 1965 ජනවාරි මස 31 වැනි දිනට පැරණි ගම් සභාව කෙරෙහි පැවරී ඇති හෝ එහි පාලනය යටතේ ඇති හෝ පහත සඳහන් චංචල දේපල 1965 පෙබරවාරි මස 1 වැනි දින දී රඹුක්පොත ගම් ප්‍රදේශයේ අලුත් ගම් සභාව කෙරෙහි පවරන ලද සේ සැලකිය යුතු අතර පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවට අයත් ඉතිරි චංචල දේපල රිල්පොල අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පවරන ලද සේ සැලකිය යුතුය :—

| | | | |
|---|---|---|---|
| අල්මාරි | ... | ... | 1 |
| පුටු | ... | ... | 12 |
| බංකු | ... | ... | 1 |
| පයිල් රාක්ක | ... | ... | 1 |
| ලියන මේස | ... | ... | 1 |
| සාමාන්‍ය මේස | ... | ... | 1 |
| ලියුම් විදින උපකරණ | ... | ... | 1 |
| ලියුම් තැටි | ... | ... | 4 |
| පයිප්ප අඬු (පරණ) | | ... | 2 |
| ටයිප් රයිටර් (සිංහල) | | ... | 1 |

(අ) වියදිගුනේ පරාක්‍රම ප්‍රජා මණ්ඩලයට, උඩවෙල තිස්ස ප්‍රජා මණ්ඩලයට, මාලනි ප්‍රජා මණ්ඩලයට, ශ්‍රී ධම්පාල ප්‍රජා මණ්ඩලයට හා

(අ) උඩවෙල මාතෘධාරකාභිවෘධි මධ්‍යස්ථානයට රිල්පොල ගම්සභාව විසින් දී ඇති සියලු දේපල.

8. පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවේ සේවයේ නියුක්තව සිටියාවූද, දැනට සිටින්නාවූද සේවකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිසවූ දායක මුදල් ගෙවීම පිළිබඳව ඊට ඇති බැරකම් පහත සඳහන් ආකාරයෙන් බෙදිය යුතුය :—

(අ) පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් දැනට ගෙවනු ලබන විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් රඹුක්පොත හා රිල්පොල යන එක් එක් ගම්ප්‍රදේශයේ අළුත් ගම්සභා අතරේ 1 : 1 ක සමානුපාතයෙන් ද,

(ආ) පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවේ සේවය කොට දැනට පිටතට මාරුකර ඇත්තාවූ සේවකයින්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් රඹුක්පොත හා රිල්පොල යන එක් එක් ගම්ප්‍රදේශයේ අළුත් ගම්සභා අතරේ 1 : 1 සමානුපාතයෙන් ද,

(ඇ) පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාවේ දැනට සේවයේ නියුක්තව සිටින්නාවූ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් රඹුක්පොත හා රිල්පොල යන එක් එක් ගම්ප්‍රදේශයේ අළුත් ගම්සභා අතරේ 1 : 1 සමානුපාතයෙන් ද බෙදිය යුතුයි.

9. මෙම උප ලේඛනයේ—

වෙනත් අන්දමකින් සඳහන් කළොත් මිස "අළුත් ගම්ප්‍රදේශය" යනුවෙන් අදහස් කරනු ලබන්නේ 1964 ජූනි 27 දින අංක 14,083 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද ආඥාවෙන් සංස්ථාපනයකර ඇති රඹුක්පොත ගම්ප්‍රදේශය හෝ 1964 ජූනි 27 වැනි දින අංක 14,083 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද ආඥාවෙන් වෙනස් කොට නැවත විස්තර කරන ලද රිල්පොල ගම් ප්‍රදේශය වේ. තවද,

"පැරණි ගම්ප්‍රදේශය" යනුවෙන් අදහස් කරනු ලබන්නේ 1965 පෙබරවාරි 1 වැනි දිනට පෙර පැවැති රිල්පොල ගම් ප්‍රදේශයයි.

9–508—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

ඇල්. ඞී—බී. 74/39—ප. පා. දෙ.—ජී.අයි. 10/3/1

## ගම්සභා ආඥපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වෙනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 5 (2) වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන අමති වරයා විසින් පනවන ලද ආඥව.

ඈම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු 25 දින,
කොළඹ දීය.

**ආඥව**

1964 ජූලි 20 වෙනි දින අංක 14,113 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශිය ආදායම් පාලක නිළධාරි කොට්ඨාශයේ පොළොන්නරුව ගම් ප්‍රදේශය සහ දිවුලාන ගම් ප්‍රදේශය නැවත බෙදා වෙන්කරන ආඥවෙහි සඳහන් කොට්ඨාශවලට බෙදීම ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය කරුණු සඳහා මීට යා කොට ඇති උප ලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් විධිවිධාන මෙයින් සළස්වනු ලැබේ.

## උපලේඛනය

1. එක් එක් අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව, එකී අළුත් ගම් ප්‍රදේශයට අදාල වියහැකි ගම් සභා ආඥපනතේ සියලුම කාර්‍යයන් සඳහා පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ අනුප්‍රාප්තික සභාව විය යුතුය.

2. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් පනවනු ලැබ මෙම ආඥව ප්‍රසිඩ කරනු ලබන දිනයෙහි වළංගුව පවත්නා සියලුම අතුරු ව්‍යවස්ථා එකී අළුත් ගම් ප්‍රදේශයට අදාළ ප්‍රමාණයට එකී එක් එක් අළුත් ගම් ප්‍රදේශය තුළ වළංගුව පැවතිය යුතුවාත් හැර, එකී අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් එම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබූ ලෙස සැළකිය යුතුය.

3. මෙම ආඥව ප්‍රසිද්ඬ කරනු ලබන දින පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ පොදු අරමුදලේ බැර පක්‍ෂයෙහි තිබෙන මුදල් ප්‍රමාණයෙන් (විදුලිය ගිනුම අතුළුව) තුනෙන් එකක් එදිනදී හෝ ඊට පසුව එක් එක් අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවේ පොදු අරමුදලට බැරකළ යුතුය.

4. මෙම ආඥව ප්‍රසිද්ධ කරනු ලබන දින, පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවන් කෙරෙහි පැවරී ඇති හෝ එහි පාලනය යටතේ ඇති පහත සඳහන් චංචල දේපල මෙම ආඥව ප්‍රසිද්ධ කරනු ලබන දිනදී එකී අළුත් ගම් සභාවන් වන මැදපත්තු උතුර, මැදපත්තු දකුණ සහ මැදපත්තු මැද ගම් සභාවන් අතරේ පහත සඳහන් ආකාරයට පවරනු ලැබේ :—

**මැදපත්තු උතුර**

| | | |
|---|---|---|
| ලියනමේස | ... | 1 යි |
| සාමාන්‍ය පුටු | .. | 10 යි |
| පන්චර් | ... | 1 යි |
| කැති | ... | 1 යි |
| උදලු (මිට සහිත) | ... | 2 යි |
| ලියනමේස (ලොකු ලාච්චු දෙක) | ... | 1 යි |
| කාර්‍යාල බන්දේසි | ... | 1 යි |
| කඩදාසි බර, වීදුරු | ... | 1 යි |
| මේස පෑඩ් (කුඩා) | ... | 1 යි |

**මැදපත්තු දකුණ**

| | | |
|---|---|---|
| යතුරු ලියන සිංහල | ... | 1 යි |
| යතුරු ලියන (ඉංග්‍රිසි) | ... | 1 යි |
| අල්මාරි | ... | 1 යි |
| ලියනමේස | ... | 2 යි |
| ඩෙස්ක් | ... | 1 යි |
| සාමාන්‍ය පුටු | ... | 15 යි |
| අත්පුටු | ... | 1 යි |
| ලියුම් රාක්ක | ... | 1 යි |
| ලියුම් බන්දේසි | ... | 1 යි |
| ඇන්වීම් පුවරු | ... | 1 යි |
| රූල් පොලු | ... | 1 යි |
| යතුරු ඉබ්බෝ | ... | 1 යි |
| පංචර් | ... | 1 යි |
| කැති | ... | 2 යි |
| උදලු (මිට සහිත) | ... | 2 යි |
| පීරි | ... | 1 යි |
| වේජ් | ... | 1 යි |
| යකඩ තාච්චි | ... | 3 යි |
| බාල්දි | ... | 1 යි |
| (හම්බර්) බයිසිකල් | ... | 1 යි |

**මැදපත්තු මැද**

| | | |
|---|---|---|
| ලියන මේස | ... | 1 යි |
| තරප්පු (ලී) | ... | 1 යි |
| ඇඳි පුටු | ... | 1 යි |
| රැස්වීම් මේස කෑලි | ... | 2 යි |
| රැස්වීම් පුටු | ... | 12 යි |
| සාමාන්‍ය පුටු | ... | 1 යි |
| ලියනමේස ලාච්චු 5 සමග | ... | 1 යි |
| කාර්යාල මුද්‍රාව | ... | 1 යි |
| ලියන මේස (කුඩා ලාච්චු 2 සමග) | ... | 1 යි |
| යතුරු ලියන මේස (ලාච්චු 3 සමග) | ... | 1 යි |
| යතුරු ලියන බංකු | ... | 1 යි |
| අල්මාරි | ... | 1 යි |
| ගෙස්ටෙට්නර් පිටපත් ගැනීමේ යන්ත්‍ර | ... | 1 යි |
| පොඩි මේස | ... | 1 යි |
| යතුරු ලියන ඔලිම්පියා සිංහල | ... | 1 යි |
| යතුරු ලියන අන්ඩවුඩ් ඉංග්‍රිසි | ... | 1 යි |
| පොත් රාක්ක | ... | 1 යි |
| රෝනියෝ පයිල් කැබිනට් | ... | 1 යි |
| කාර්‍යාල බන්දේසි | ... | 2 යි |
| තට්ටු තුනේ පොඩි රාක්ක | ... | 1 යි |
| පන්චර් (හිල් දෙක සහිත) | ... | 1 යි |
| කඩදාසි බර, වීදුරු | ... | 2 යි |
| පෑඩ්—මේස | ... | 1 යි |
| පෑඩ්—තීන්ත පොවන | ... | 2 යි |
| තීන්ත කූඩු (කුප්පි තුන සහිත) | ... | 1 යි |
| තීන්ත කූඩු (කුඩා) | ... | 1 යි |
| ඩැම්බර් (වතුර) | ... | 1 යි |
| ලියුම් රාක්ක (කාමර තුන) | ... | 1 යි |
| වේවැල් කූඩා (කුණු දමන) | ... | 1 යි |
| බයිසිකල් රූලේ | ... | 1 යි |
| බිත්ති ඔර්රෝසු (විල්කෝ) | ... | 1 යි |
| රෙක්ෂල් (කඩදාසි විදින) | ... | 1 යි |
| බයිසිකල් යතුරු | ... | 1 යි |

5. මෙම ආඥව ප්‍රසිද්ධ කරනු ලබන දින දී පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරී ඇති එක් එක් ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ අනිකුත් නිශ්චල දේ පලක් මෙම අඥව ප්‍රසිද්ධ කරනු ලබන දින දී එම ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේ පල පිහිටි ගම් ප්‍රදේශයේ ගම්සභාව වෙත පැවරී ඇති ලෙස සැළකිය යුතුයි.

6. පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවේ අයිතිවාසිකම්, ණය තුරුස්, බැරකම් හා බැඳීම් සියල්ලක්ම ඒවා එක් එක් අළුත් ගම් ප්‍රදේශයට අදාළ වන ප්‍රමාණයට මෙම ආඥව ප්‍රසිද්ධ කරනු ලබන දින සිට එකී අළුත් ප්‍රදේශයේ ගම් සභාවට පවරනු ලැබූ ලෙස සැළකිය යුතුයි.

7. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභා කාර්‍යාලයන්හි පවත්වාගෙන යනු ලැබූ සියලුම ලිපි ගොනු හා ලේඛන ඒවා එක් එක් අළුත් ගම් ප්‍රදේශයට අදාළ වන ප්‍රමාණයට මේම ආඥව ප්‍රසිද්ධ කරනු ලබන දින සිට එකී අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභා කාර්‍යාලයට මාරු කරණු ලැබූ ලෙස සැළකිය යුතුය.

8. පැරණි ගම්සභාවේ සේවයේ නියුක්තව සිටියාවූ ද, දැනට සිටින්නාවූ ද, සේවකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස වූ දායක මුදල් ගෙවීම පිළිබඳ වගකීම පහත සඳහන් ආකාරයෙන් බෙදිය යුතුය :—

(ආ) පැරණි ගම්සභාවේ කළක් සේවය කොට දැනට පිටතට මාරුකර ඇත්තාවූ සේවකයන්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් මැද පත්තු උතුර, මැද පත්තු මැද, හා මැද පත්තු දකුණ යන අළුත් ගම්සභා අතරේ 1 : 1 : 1 සමානුපාත යෙන් ද,

(ආ) පැරණි ගම්සභාවේ දැනට සේවයේ නියුක්තව සිටින්නාවූ තැනැත්තන්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් මැද පත්තු උතුර, මැද පත්තු මැද සහ මැද පත්තු දකුණ යන අළුත් ගම්සභා අතරේ 1 : 1 : 1 සමානුපාතයෙන්ද බෙදිය යුතුය.

9. මෙම උපලේඛනය—

අන් ලෙසකින් නිශ්චිතව සඳහන් නොකරනු ලැබුවහොත්, "අළුත් ගම්ප්‍රදේශය" යනුවෙන් අදහස් කරනු ලබන්නේ 1964 ජූලි 20 වැනි දින අංක 14,113 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආඥවෙහි විස්තර කොට ඇති මැද පත්තු උතුර, මැද පත්තු මැද සහ මැද පත්තු දකුණ ගම් සභා ප්‍රදේශයන්ය.

අන් ලෙසකින් සඳහන් නො කරනු ලැබුවහොත් "පැරණි ගම් ප්‍රදේශය" යනුවෙන් පොළොන්නරුව ගම් ප්‍රදේශය හා දිවුලාන ගම් ප්‍රදේශය අදහස් වේ.

9-507—65.9.9 දින අංක 14,501 දරණ ගැසට් පත්‍රය

ඇල්.ඩී.—බී. 9/64(ɪ1)
එල්.ජී.ඩී.—ජීඑෆ්. 11/6බී.

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 5(2) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් පනවන ලද ආඥාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු 31 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

1964 ජූලි 31 වැනි දින අංක 14,126 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කන්දපහල කෝරළේ ගම් ප්‍රදේශය බෙදා වෙන් කිරීමට අදාළ ආඥාවේ සඳහන් බෙදා වෙන් කිරීම ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය කරුණු සඳහා මීට යා කොට ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි විධිවිධාන මෙයින් සලස්වනු ලැබේ.

### උපලේඛනය

1. එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව ඒ ගම් ප්‍රදේශයට අදාළ විය හැකි පරිදි ගම්සභා ආඥාපනතේ සියළුම කාර්යයන් සඳහා පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවේ අනුප්‍රාප්තික සභාව විය යුතුය.

2. පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව 1965හේ ජනවාරි මස 31 වෙනි දින වලංගුව පැවති සියළුම අතුරු ව්‍යවස්ථා ඒ අලුත් ගම් ප්‍රදේශයට අදාල ප්‍රමාණයට එක් එක් අලුත් ගම් ප්‍රදේශය තුළ වලංගුව පැවතිය යුතුවාත් හැර, ඒ අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් ඒ අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

3. 1965 ජනවාරි 31 වෙනි දිනට පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ පොදු අරමුදලේ බැර පක්ෂයට තිබූ මුදල් ප්‍රමාණයෙන් හතෙන් දෙකක් 1965 පෙබරවාරි 1 වෙනි දින සිට හසලක අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාවේ පොදු අරමුදලට බැර කළ යුතු අතර හතෙන් පහක් මිණිපේ අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවේ පොදු අරමුදලට බැර කළ යුතු ය.

4. 1965 ජනවාරි 31 වෙනි දින පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත හෝ එහි පාලනය යටතට පවරනු ලැබ තිබූ පහත සඳහන් චංචල දේපොළ 1965 පෙබරවාරි 1 වැනි දින සිට මිණිපේ අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පවරන ලද සේ සැලකිය යුතුය. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ ඉතිරි චංචල දේපොල අළුත් හසලක ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත පැවරිය යුතු ය :—

| | |
|---|---|
| අඩි කෝදු | 1 සි |
| ලියුම් බන්දේසි (ලී) | 1 සි |
| පංචර් | 1 සි |
| ලියන මේස | 1 සි |
| ටයිපින් මේස | 1 සි |
| සිංහල ටයිප්රයිටර් (ඔලිම්පියා) | 1 සි |
| පයිල් බහාලන අල්මාරි | 1 සි |
| කබඩ් | 1 සි |
| උදළු | 2 සි |
| කැති | 1 සි |
| පිහිය | 1 සි |
| පොරෝ | 1 සි |
| කසළ කරත්ත | 1 සි |
| වැසිකිළි බාල්දි | 2 සි |
| ගැල්වනයිස් බාල්දි | 1 සි |
| ඔරු | 2 සි |

5. 1965 ජනවාරි 31 වෙනි දින පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාව වෙත එහි පාලනය යටතට පවරනු ලැබ තිබූ එක් එක් ඉඩම, ගොඩනැගිලි හෝ අනිකුත් නිශ්චල දේපොළ 1965 පෙබරවාරි 1 වෙනි දින සිට එම ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපොළ පිහිටියාවූ අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත පවරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

6. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ සියලුම අයිතිවාසිකම්, ණය තුරුස්, වගකීම් හා බැඳීම් ඒවා එක් එක් අලුත් ප්‍රදේශයට අදාළ ප්‍රමාණයට 1965 පෙබරවාරි 1 වෙනි දින සිට ඒ අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවට මාරු කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

7. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභා කාර්යාලයේ පවත්වාගෙන යනු ලැබූ සියළුම ලිපිගොනු, ලිපි හා ලේඛන ඒවා එක් එක් අලුත් ගම් ප්‍රදේශයට අදාළ ප්‍රමාණයට 1965 පෙබරවාරි 1 වෙනි දින සිට ඒ අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභා කාර්යාලයට මාරු කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

8. පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවේ සේවයෙහි නියුක්තව සිටියාවූද, දැනට සිටින්නාවූද, සේවකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස දායක මුදල් ගෙවීම පිළිබඳව ඊට ඇති වගකීම් පහත සඳහන් ආකාරයට බෙදිය යුතුය :—

(අ) පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් දැනට ගෙවනු ලබන විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් මිණිපෙ සහ හසලක යන අලුත් ගම් සභා අතරේ 5 :2 සමානුපාතයෙන් ;

(ආ) පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ සේවය කොට දැනට පිටතට මාරු කර ඇත්තාවූ සේවකයන්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් මිණිපෙ සහ හසලක යන අලුත් ගම් සභා අතරේ 5 : 2 සමානුපාතයෙන් ; සහ

(ඇ) පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ දැනට සේවයෙහි නියුක්තව සිටින්නාවූ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් මිණිපෙ සහ හසලක යන ගම් සභා අතරේ 5 :2 සමානුපාතයෙන්.

9. මේ උපලේඛනයේ—

වෙනත් අන්දමකින් සඳහන් කළහොත් මිස, "අලුත් ගම් ප්‍රදේශය" යන්නෙන්, ගම් සභා ආඥාපනතේ 5(1) වන වගන්තිය යටතේ 1964 ජූලි 31 වැනි දින අංක 14,126 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවට යාකොට ඇති උපලේඛනයේ විස්තර කර ඇති හසලක ගම් ප්‍රදේශය හෝ මිණිපෙ ගම් ප්‍රදේශය අදහස් වේ. එමෙන් ම

"පැරණි ගම් ප්‍රදේශය" යන්නෙන් 1965 පෙබරවාරි 1 වන දිනට පෙර පැවති කන්දපහළ කෝරළේ ගම් ප්‍රදේශය අදහස් වේ.

9–510—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී—බී. 9/64 (61)
ඇල්.ජී.ඩී—ජීසී. 15/2/4

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 5 (1) වැනි වගන්තියෙන් සහ (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු 25 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 5 (1) වැනි වගන්තිය යටතේ සම්පාදිතව, 1964 ජූලි 13 වැනි දින අංක 14,106 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ හලාවත දිස්ත්‍රික්කයේ උතුරු පිටිගල් කෝරළේ දේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මුන්නේස්වරම් පත්තු ගම් ප්‍රදේශය, කාක්කපල්ලිය සහ මුන්නේස්වරම් යනුවෙන් අළුත් ගම් ප්‍රදේශ දෙකකට බෙදීම පිළිබඳ ආඥාව, එහි 2 වැනි ඡේදයෙහි (ආ) උප ඡේදයේ "1965 ජූලි" යන පාඨය වෙනුවට "1966 පෙබරවාරි" යන පාඨය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

9–531/1—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 8 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුචෙල්වම් වන මම, 1964 ජූලි 13 වැනි දින අංක 14,106 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ, හලාවත දිස්ත්‍රික්කයේ උතුරු පිටිගල් කෝරළේ දේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කාක්කපල්ලිය සහ මුන්නේස්වරම් යන ගම් ප්‍රදේශ, ඡන්ද කොට්ඨාශ වලට නැවත බෙදා වෙන් කිරීම පිළිබඳ නිවේදනය, එහි (3) වැනි ඡේදයෙහි (අ) වැනි උප ඡේදයෙහි "1965 ජූලි" යන පාඨය වෙනුවට "1966 පෙබරවාරි" යන පාඨය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරමි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු 25 වැනි දින,
කොළඹ දී ය.

9–531/2—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

## ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 10 වැනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුචෙල්වම් වන මම, කාක්කපල්ලිය සහ මුන්නේස්වරම් යන එක් එක් ගම් ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ගම් සභාවේ නිල කාලය ආරම්භ විය යුතු දිනය නියම කරමින්, (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ සම්පාදිතව, 1964 ජූලි 13 වැනි දින අංක 14,106 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ආඥාව, එහි "1965 ජූලි 1 වැනි දින" යන පාඨය වෙනුවට "1966 පෙබරවාරි 1 වැනි දින" යන පාඨය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරමි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු 25 වැනි දින,
කොළඹ දී ය.

9–531/3—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 5 (2) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු 25 වැනි දින,
කොළඹ දීය.

### ආඥාව

හලාවත දිස්ත්‍රික්කයේ උතුරු පිටිගල් කෝරළේ දේශීය ආදායම් නිලධාරියාගේ කොට්ඨාශයේ මුන්නේස්වරම් පත්තු ගම් ප්‍රදේශය, කාක්කපල්ලිය සහ මුන්නේස්වරම් යනුවෙන් ගම් ප්‍රදේශ දෙකකට බෙදීම වලංගු කිරීම සඳහා අවශ්‍ය කරුණු සම්බන්ධයෙන් 1964 දෙසැම්බර 24 වැනි දින අංක 14,265 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ආඥාවේ උපලේඛනය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපලේඛනයෙහි, "1965 ජූනි 30 වැනි දින" යන පාඨය දැක්වෙන කවර ස්ථානයක වුවද, ඒ වෙනුවට "1966 ජනවාරි 31 වැනි දින" යන පාඨය ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ උපලේඛනයෙහි, "1965 ජූලි 1 වැනි දින" යන පාඨය දැක්වෙන කවර ස්ථානයක වුවද, ඒ වෙනුවට, "1966 පෙබරවාරි 1 වැනි දින" යන පාඨය ආදේශ කිරීමෙන්.

9–531/4—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත

(262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු 25 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

(262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තිය යටතේ සම්පාදිතව, 1964 ජූලි 13 වැනි දින අංක 14,106 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ, හලාවත දිස්ත්‍රික්කයේ කාක්කපල්ලිය සහ මුන්නේස්වරම් යන ගම් ප්‍රදේශවලට අදාළ ආඥාව, එහි (1) සහ (2) වැනි එක් එක් ඡේදයන්හි "1965 ජූලි" යන පාඨය වෙනුවට "1966 පෙබරවාරි" යන පාඨය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

9–531/5—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී. 9/64 (6)

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත

(262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් පිළිබඳ ආඥාපනතේ 84 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

වර්ෂ 1965 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

(262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් පිළිබඳ ආඥාපනතේ 84 වැනි වගන්තිය යටතේ පනවනු ලැබ, 1964 ජූලි 3 වැනි දින අංක 14,092 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද, මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර සහ යටිනුවර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උඩුනුවර මැද පළාත උතුර සහ උඩුනුවර මැද පළාත දකුණ යන ගම් ප්‍රදේශවලට අදාළවූ ආඥාවේ පූර්විකාව පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) එහි (1) වැනි ඡේදයෙහි "1965 පෙබරවාරි 1 වැනි දින සිට" යන වචන හා ඉලක්කම් වෙනුවට, "1966 පෙබරවාරි 1 වැනි දින සිට" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) එහි (2) වැනි ඡේදයෙහි, "1965 ජනවාරි 1 වැනි දින සිට" යන වචන හා ඉලක්කම් වෙනුවට "1966 ජනවාරි 1 වැනි දින සිට" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

9–511/1—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී. 9/64 (6)

## ගම්සභා ආඥාපනත සහ ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීමේ ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 (1) වැනි වගන්තියෙන් සහ (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තියෙන් ද තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

වර්ෂ 1965 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 5 (1) වැනි වගන්තිය සහ (252 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීමේ ආඥාපනතේ 84 වැනි වගන්තිය යටතේ පනවනු ලැබ, 1964 ජූලි 3 වැනි දින අංක 14,092 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද, මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර සහ යටිනුවර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උඩුනුවර මැදපළාත ගම් ප්‍රදේශය නැවත බෙදා වෙන් කිරීමට අදාළ ආඥාව, එහි 2 (ආ) වැනි ඡේදයෙහි "1965 පෙබරවාරි 1 වැනි දින සිට" යන වචන හා ඉලක්කම් වෙනුවට "1966 පෙබරවාරි 1 වැනි දින සිට" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

9–511/2—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

ඇල්.ඩී.—බී. 9/64 (6)

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත පරිදි (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 8 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම, 1964 ජුලි 10 වැනි දින අංක 14,102 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර සහ යටිනුවර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උඩුනුවර මැද පළාත දකුණ සහ උඩුනුවර මැද පළාත උතුර යන එක් එක් ගම් ප්‍රදේශයෙහි දැනට පවත්නා ඡන්දදායක කොට්ඨාශ අළුත් ඡන්ද කොට්ඨාශවලට නැවත බෙදා වෙන් කිරීමට අදාළ නිවේදනය පහත දැක්වෙනයේ මෙයින් සංශෝධනය කරමි:—

(අ) එහි 3 (අ) වැනි ඡේදයෙහි "1964 වැනි වර්ෂයේ" යන වචන හා ඉලක්කම් වෙනුවට "1966 වැනි වර්ෂයේ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ,

(ආ) එහි 3 (ආ) වැනි ඡේදයෙහි, "1965 පෙබරවාරි 1 වැනි දින සිට" යන වචන හා ඉලක්කම් වෙනුවට "1966 පෙබරවාරි 1 වැනි දින සිට" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

වර්ෂ 1965 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

9–511/3—65. 9. 9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී 9/64 (62).
ප. පා. දෙ.—ජී. ඒ. 10/2/1.

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5(2) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් පනවන ලද ආඥාව.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු 25 දින,
කොළඹ දී ය.

### ආඥාව

1964 ජුලි මස 31 වැනි දින අංක 14,126 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද මොණරාගල දිස්ත්‍රික්කයේ වෙල්ලස්ස, මොණරාගල, හා මඩුල්ල යන ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශ ඇතුලත පිළිවෙලින් පිහිටි වැගම්පත්තු නිල්ගල, බුත්තල වැදිරට හා දඹගල්ල යන ගම් ප්‍රදේශ තුන බිබිල, කොටගම, මොණරාගල, සියඹලාඬුව හා දඹගල්ල යන ගම් ප්‍රදේශ පහකට බෙදා වෙන් කිරීමේ ආඥාවල සඳහන් බෙදා වෙන් කිරීම් ක්‍රියාත්මක කිරීම පිණිස මීට යාකොට ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි විධිවිධාන මෙයින් සලස්වනු ලැබේ.

### උපලේඛනය

(1) එක් එක් අළුත් ගම්ප්‍රදේශයේ ගම්සභාව, ඒ අලුත් ගම් ප්‍රදේශයට අදාළ විය හැකි පරිදි ගම්සභා ආඥාපනතේ සියළුම කාර්‍යයන් සඳහා පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවේ අනුප්‍රාප්තික සභාව විය යුතුය.

(2) පැරණි ගම්ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව 1965 ජනවාරි 31 වැනි දින වලංගුව පවත්නා සියළුම අතුරු ව්‍යවස්ථා ඒ අලුත් ගම්ප්‍රදේශයට අදාළ ප්‍රමාණයට ඒ එක් එක් අලුත් ගම් ප්‍රදේශය තුළ වලංගුව පැවතිය යුතුවාත් හැර ඒ අලුත් ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් ඒ අතුරු ව්‍යවස්ථා සම්පාදිත ලෙසින් ද සැලකිය යුතුය.

(3) 1965 ජනවාරි 31 වැනි දිනට පැරණි ගම්ප්‍රදේශවල ගම්සභාවල පොදු අරමුදලට බැරකරනු ලැබ තිබූ මුදල් පහත සඳහන් ආකාරයට බෙදිය යුතුය:—

(අ) පැරණි වැගම්පත්තු-නිල්ගල ගම්ප්‍රදේශයේ ගම්සභාවේ පොදු අරමුදලෙන් සියයට 50 ක් 1965 පෙබරවාරි 1 වන දින බිබිල ගම්ප්‍රදේශයේ ගම්සභාවේ පොදු අරමුදලට බැර කළ යුතු අතර, ඉතිරි සියයට 50 එදිනම කොටගම ගම් ප්‍රදේශයේ ගම්සභාවේ පොදු අරමුදලට බැර කළ යුතුය.

(ආ) පැරණි බුත්තල-වැදිරට ගම්සභාවේ පොදු අරමුදලෙන් පහෙන් දෙකොටසක් 1965 පෙබරවාරි 1 වන දින සියඹලාඬුව ගම්ප්‍රදේශයේ ගම්සභාවේ පොදු අරමුදලට බැර කළ යුතුය. එකී පැරණි සභාවේ පොදු අරමුදලේ ඉතිරි පහෙන් තුන් කොටස එදිනම මොණරාගල ගම්ප්‍රදේශයේ අලුත් ගම්සභාවේ පොදු අරමුදලට බැර කළ යුතුය.

(ඇ) දඹගල්ල පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාවේ පොදු අරමුදලෙන් තුනෙන් එක් කොටසක් 1965 පෙබරවාරි 1 වන දින සිට සියඹලාඬුව ගම්ප්‍රදේශයේ අලුත් ගම්සභාවේ පොදු අරමුදලට බැර කළ යුතුය.

4. 1965 ජනවාරි 31 වැනි දින පැරණි ගම්ප්‍රදේශවල ගම්සභා කෙරෙහි පැවරී තිබූ හෝ ඒවායේ පාලනය යටතේ පැවති චංචල දේපොළ පහත සඳහන් ප්‍රකාර 1965 පෙබරවාරි 1 වන දින සිට අලුත් ගම්ප්‍රදේශවල ගම්සභා කෙරෙහි පැවරිය යුතුය:—

(අ) වැගම්පත්තු නිල්ගල පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරී තිබූ හෝ එහි පාලනය යටතේ පැවති පහත සඳහන් චංචල දේපොළ කොටගම අලුත් ගම්ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරිය යුතු අතර, එකී පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවේ ඉතිරි චංචල දේපළ බිබිල අලුත් ගම්ප්‍රදේශයේ ගම්සභාව වෙත පැවරිය යුතුය:—

**කොටගම ගම්සභාව කෙරෙහි පවරනු ලබන චංචල දේපොළ:—**

| | | |
|---|---|---|
| අලුත් ලී අල්මාරි | ... | 1 යි. |
| අලුත් යකඩ ෆයිල් කැබිනට් | ... | 1 යි. |
| කුඩා අල්මාරි | ... | 1 යි. |
| ලාච්චු සහිත ලියන මේස | ... | 2 යි. |
| ලාච්චු සහිත පරණ ලියන මේස | ... | 1 යි. |
| සාමාන්‍ය පුටු | ... | 12 යි. |
| ඇඳි පුටු | ... | 4 යි. |
| මේස (සාමාන්‍ය) | ... | 2 යි. |
| රැස්වීම් ශාලා මේස | ... | 1 යි. |
| ඔලිම්පියා සිංහල යතුරු ලියන | ... | 1 යි. |
| බන්කු | ... | 1 යි. |
| දින මුද්‍රා | ... | 1 යි. |
| කුඩා මේස | ... | 1 යි. |
| උදළු | ... | 6 යි. |
| කැති | ... | 7 යි. |
| පොරෝ | ... | 1 යි. |

(ආ) බුත්තල වැදිරට පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරී තිබූ හෝ එහි පාලනය යටතේ පැවති පහත සඳහන් චංචල දේපළ සියඹලාඬුව අලුත් ගම්ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පැවරිය යුතු අතර, එකී පැරණි ගම් ප්‍රදේශයේ ඉතිරි චංචල දේපළ මොණරාගල අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරිය යුතුය.

**මොණරාගල ගම්සභාව කෙරෙහි පවරනු ලබන දේපළ:—**

මේස 1යි, අත් පුටු 4 යි, ඇඳි සහිත බංකු 1 යි, වෙන්ඩර් පෙට්ටි 1 යි, සාමාන්‍ය පුටු 1 යි, දැන්වීම් පුවරු 1 යි.

5. පැරණි ගම්ප්‍රදේශවල ගම්සභා කෙරෙහි පැවරී තිබූ හෝ ඒවායේ පාලනය යටතේ පැවති එක් එක් ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපොළ, ඒවා එක් එක් අළුත් ගම්ප්‍රදේශයට අදාළවන ප්‍රමාණයට ඒ අලුත් ගම්ප්‍රදේශයේ ගම්සභාව වෙත 1965 පෙබරවාරි 1 වන දින සිට පැවරිය යුතුය.

6. පැරණි ගම් ප්‍රදේශවල ගම්සභාවල සියලුම අයිතිවාසිකම්, නය තුරුස්, වගකීම් හා බැඳීම්, ඒවා එක් එක් අලුත් ප්‍රදේශයට අදාළ ප්‍රමාණයට 1965 පෙබරවාරි 1 වැනි දින සිට ඒ අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාවට මාරුකරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

7. පැරණි ගම් ප්‍රදේශවල ගම්සභා කාර්‍යාලවල පවත්වාගෙන යනු ලැබූ සියළුම ලිපිගොනු හා ලේඛන ඒවා එක් එක් අලුත් ගම් ප්‍රදේශයට අදාළ ප්‍රමාණයට 1965 පෙබරවාරි 1 වැනි දින සිට ඒ අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභා කාර්‍යාලයට මාරු කරනු ලැබූ ලෙස සැලකිය යුතුයි.

8. පැරණි ගම්සභාවල සේවයේ නියුක්තව සිටියාවූ ද දැනට සිටින්නාවූද සේවකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස වූ දායක මුදල් ගෙවීම පිළිබඳව ඒවා, සතු වගකීම් පහත සඳහන් ආකාරයෙන් බෙදිය යුතුය:—

(අ) (1) වැගම්පත්තු-නිල්ගල ගම් ප්‍රදේශයේ පැරණි ගම්සභාව විසින් දැනට ගෙවනු ලබන විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් අළුත් කොටගම හා බිබිල යන ගම්ප්‍රදේශවල අළුත් ගම්සභා අතර 1:1 අනුපාතයෙන්.

(2) වැගම්පත්තු නිල්ගල ගම්ප්‍රදේශයේ පැරණි ගම්සභාවේ සේවය කොට දැනට පිටතට මාරුකොට ඇත්තාවූ සේවකයින්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් කොටගම හා බිබිල යන ගම් ප්‍රදේශවල අළුත් ගම්සභා අතර 1 : 1 අනුපාතයෙන්.

(ආ) (1) බුත්තල වැදිරට ගම් ප්‍රදේශයේ පැරණි ගම්සභාව විසින් දැනට ගෙවනු ලබන විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් මොණරාගල හා සියඹලාඬුව යන ගම්ප්‍රදේශවල අළුත් ගම්සභා අතර 5 : 2 අනුපාතයෙන්.

(2) බුත්තල වැදිරට ගම් ප්‍රදේශයේ පැරණි ගම්සභාවේ සේවය කොට දැනට පිටතට මාරුකොට ඇත්තාවූ සේවකයින්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් මොණරාගල හා සියඹලාඬුව යන ගම් ප්‍රදේශවල අලුත් ගම්සභා අතර 5 : 2 අනුපාතයෙන්.

(ඇ) (1) පැරණි දඹගල්ල ගම් ප්‍රදේශයේ පැරණි ගම්සභාව විසින් දැනට ගෙවනු ලබන විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් දඹගල්ල හා සියඹලාඬුව යන ගම් ප්‍රදේශවල අළුත් ගම්සභා අතර 3 : 1 අනුපාතයෙන්.

(2) දඹගල්ල ගම් ප්‍රදේශයේ පැරණි ගම් සභාවේ සේවයකොට දැනට පිටතට මාරුකොට ඇත්තාවූ සේවකයින්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් දඹගල්ල හා සියඹලාඬුව යන ගම් ප්‍රදේශවල අළුත් ගම් සභා අතර 3 : 1 අනුපාතයෙන්.

(3) දඹගල්ල ගම් ප්‍රදේශයේ පැරණි ගම්සභාවේ දැනට සේවයේ නියුක්තව සිටින්නාවූ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් දඹගල්ල හා සියඹලාඬුව යන ප්‍රදේශවල අලුත් ගම්සභා අතර 3 : 1 අනුපාතයෙන්.

9. මෙම උපලේඛනයේ—

වෙනත් අන්දමකින් නිශ්චිතව සඳහන් කළහොත් මිස, " අලුත් ගම්ප්‍රදේශය " යනුවෙන් 1964 ජූලි 31 වන දින අංක 14,126 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද ආඥාවලට යාකොට ඇති උපලේඛන වල විස්තර කර ඇති හෝ නැවත විස්තර කර ඇති බිබිල කොටගම, මොණරාගල, සියඹලාඬුව හා දඹගල්ල යන ගම් ප්‍රදේශ වලින් යම් සභාවක් අදහස් වේ; එමෙන්ම වෙනත් අන්දමකින් නිශ්චිතව සඳහන් කළහොත් මිස, " පැරණි ගම් ප්‍රදෙශය " යනුවෙන්, එකී අලුත් ගම් ප්‍රදේශ 1965 පෙබරවාරි 1 වැනි දිනට පෙර ඇතුළත්ව තුබූ වැගම්පත්තු නිල්ගල, බුත්තල වැදිරට හා දඹගල්ල යන ගම් ප්‍රදේශ වලින් යම් සභාවක් අදහස් වේ.

9-489/1—65. 9. 9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඕ—බී. 9/64 (12)
ප. පා. දෙ.—ජී. ඒ. 10/1/11

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 5 (2) වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ අඥාවකි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

වර්ෂ 1965 ක්වූ අගෝස්තු මස 25 දින,
කොළඹදීය.

### ආඥාව

බදුල්ල දිස්ත්‍රික්කයේ පස්සර ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ පස්සර ගම් ප්‍රදේශයෙන් ඉවත්කළ ප්‍රදේශය වෙනුවෙන් මඩුල්සිම නමින් අලුත් ගම් සභවක ඇතිකිරීමට අදාළව 1964 ජූනි මස 22 දින අංක 14,073 දරන ගැසට් පත්‍රයේ පලකරන ලද ආඥා ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය කරුණු සඳහා මීට යාකොට ඇති උපලේඛනයේ දක්වා ඇති ආකාරයෙන් මෙයින් විධිවිධාන සලස්වනු ලැබේ :—

## උපලේඛනය

1. අලුත් මඩුල්සිම ගම් සභාව ඒ අලුත් ගම් ප්‍රදේශයට අදාළ විය හැකි පරිදි ගම් සභා ආඥාපනතේ සියලු කාර්‍යයන් සඳහා අලුත් ගම් ප්‍රදේශය කලින් ඇතුලත්ව තිබූ පස්සර ගම් ප්‍රදේශයේ ගම්සභාවේ අනු ප්‍රාප්තික සභාවක් විය යුතුය.

2. පස්සර ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව 1965 ජනවාරි මස 31 වැනි දින වලංගුව පවත්නා සියලුම අතුරු ව්‍යවස්ථා ඒ මඩුල්සිම ගම් ප්‍රදේශයට අදාළ ප්‍රමාණයට මඩුල්සිම ගම් ප්‍රදේශය තුළ වලංගුව පැවතිය යුතුවාත් හැර ඒ අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් ඒ අතුරු ව්‍යවස්ථා සම්පාදිත ලෙසින්ද සැලකිය යුතුය.

3. 1965 ජනවාරි මස 31 වැනි දින පස්සර ගම් ප්‍රදේශයේ ගම් සභාවේ පොදු අරමුදලේ බැර පක්ෂයට තිබූ මුදල් ප්‍රමාණයෙන් අඩක් 1965 පෙබරවාරි 1 වැනි දිනදී මඩුල්සිම ගම් ප්‍රදේශයේ ගම් සභාවේ පොදු අරමුදලට බැරකල යුතුය .

4. 1965 ජනවාරි මස 31 වැනි දින පස්සර ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත පැවරී තිබූ හෝ එහි පාලනය යටතේ පැවති මඩුල්සිම අලුත් ගම් ප්‍රදේශය තුළ පිහිටි එක් එක් ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපළ 1965 පෙබරවාරි 1 වැනි දින සිට ඒ දේපළ පිහිටියාවූ මඩුල්සිම අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත පවරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

5. පස්සර ගම් ප්‍රදේශයේ ගම් සභාවේ සියලුම අයිතිවාසිකම්, නය තුරුස්, වගකීම් හා බැඳීම් ඒවා මඩුල්සිම ගම් ප්‍රදේශයට අදාළ ප්‍රමාණයට 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට ඒ අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවට මාරුකරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

6. පස්සර ගම් ප්‍රදේශයේ ගම් සභා කාර්‍යාලයේ පවත්වාගෙන යනු ලැබූ සියලු ලිපිගොනු හා ලේඛන ඒවා මඩුල්සිම ගම් ප්‍රදේශයට අදාළ ප්‍රමාණයට 1965 පෙබරවාරි මස 1 වැනි දින සිට ඒ මඩුල්සිම ගම් ප්‍රදේශයේ ගම් සභා කාර්‍යාලයට මාරකරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

7. 1965 ජනවරි මස 31 වැනි දින පස්සර ගම් සභාව කෙරෙහි පැවරී තිබූ හෝ එහි පාලනය යටතේ පැවති පහත සඳහන් චංචල දේපළ 1965 පෙබරවාරි 1 වැනි දින සිට මඩුල්සිම ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පවරන ලද සේ සැලකිය යුතුය :—

| | | |
|---|---|---|
| ඇඳි සහිත පුටු | ... | 2 යි |
| ලියන මේස | ... | 1 යි |
| යතුරුලියන (සිංහල) | ... | 1 යි |
| කඩදාසි කපන පංචර් | ... | 1 යි |
| බ්ලොටින් පෑඩ් | ... | 1 යි |
| කසල ඉවත්කරන (පරන) කරත්ත | ... | 1 යි |
| ලාච්චු මේස | ... | 1 යි |
| මේස රෙදි | ... | 1 යි |
| කාර්‍යාල සීනු | ... | 1 යි |
| පේපර් වේට් (වීදුරු) | ... | 1 යි |
| අයිස්බෝතල (රූජාලියා) | ... | 1 යි |
| වීදුරු තීන්ත කුඩු | ... | 1 යි |

8. පැරණි ගම්සභාවේ සේවයේ නියුක්තව සිටියාවූද, දැනට සිටින්නාවූද සේවකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස වූ ආයක මුදල් ගෙවීම පිළිබඳව ඊට ඇති වගකීම් පහත සඳහන් ආකාරයෙන් බෙදිය යුතුය :—

(අ) පැරණි ගම්සභාව විසින් දැනට ගෙවනු ලබන විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් මඩුල්සිම හා පස්සර යන අලුත් ගම්සභා අතර 1 : 1 ක සමානුපාතයෙන්.

(ආ) පැරණි ගම්සභාවේ සේවය කොට දැනට පිටතට මාරුකර ඇත්තාවූ සේවකයින්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් මඩුල්සිම හා පස්සර යන අලුත් ගම්සභා අතර 1 : 1 සමානුපාතයෙන්.

(ඇ) පැරණි ගම්සභාවේ දැනට සේවයේ නියුක්තව සිටින්නාවූ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් මඩුල්සිම හා පස්සර යන අලුත් ගම්සභා අතර 1 : 1 සමානුපාතයෙන්.

9. මෙම උප ලේඛනයේ—

වෙනත් අන්දමකින් සඳහන්කලොත් මිස " අලුත් ගම්ප්‍රදේශය " යනුවෙන් 1964 ජූනි 22 වන දින අංක 14,073 දරන ගැසට් පත්‍රයේ පලකරනලද ආඥාවලින්, පිළිවෙලින් සංස්ථාපනය කරන ලද හෝ නැවත විස්තර කරන ලද පස්සර හෝ මඩුල්සිම ගම්ප්‍රදේශ අදහස් වන අතර " පැරණි ගම්ප්‍රදේශය " යනුවෙන් ඉහත සඳහන් මඩුල්සිම හා පස්සර යන අලුත් ගම්ප්‍රදේශ වලින් සමන්විතව තිබූ පස්සර ගම්ප්‍රදේශය අදහස් වේ.

9-489/2—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

ඇල්.ඞී.—බී. 9/64(67).
ප.පා.දෙ.—ජීඒ. 10/4/1.

## ගම්සභා ආඥා පනත

1961 අංක 60 දරන පනතින් සංශොධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5(2) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් පනවන ලද ආඥාවයි.

එම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු මස 25 දින,
කොළඹ දී ය.

### ආඥාව

1964 ජූලි 31 වැනි දින අංක 14,126 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පල කරන ලද ආඥාවෙහි සඳහන් වව්නියා දිස්ත්‍රික්කයේ මුලතිව් ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පුදුකුඩිඉරුප්පු ගම් ප්‍රදේශයේ සීමා වෙනස් කිරීම හා විස්තර කිරීම සහ 1964 සැප්තැම්බර් 23 වන දින අංක 14,177 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනලද ආඥාවෙන් සංශෝධිත 1964 ජූලි 31 වන දින අංක 14,126 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවෙහි සඳහන් වවුනියා දිස්ත්‍රික්කයේ මුලතිව් ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උතුරු කරික්කඩ්ඩුමූලෙයි ගම්ප්‍රදේශය සංස්ථාපනය කිරීම ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය කරුණු සඳහා මීට යාකොට ඇති උපලේඛනයේ දක්වා ඇති ආකාරයෙන් මෙයින් විධිවිධාන සලස්වනු ලැබේ.

### උපලේඛනය

(1) එක් එක් අලුත් ගම්ප්‍රදේශයේ ගම්සභාව, ඒ අලුත් ගම් ප්‍රදේශයට අදාල විය හැකි පරිදි ගම්සභා ආඥාපනතේ සියලුම කාර්යයන් සඳහා පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාවේ අනුප්‍රාප්තික සභාව විය යුතුය.

(2) පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් ගම්සභා ආඥාපනත යටතේ සම්පාදිතව 1965 ජනවාරි තිස්එක් වැනි දින වලංගුව පැවති සියලුම අතුරු ව්‍යවස්ථා ඒ එක් එක් අලුත් ගම් ප්‍රදේශය තුළ වලංගුව පැවතිය යුතුවාත් හැර, ඒ අලුත් ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් ඒ අතුරු ව්‍යවස්ථා සම්පාදිතව ඇති ලෙස සැළකිය යුතුය.

(3) මේ උපලේඛනයේ 4 වැනි ඡේදයේ විධිවිධානවලට යටත්ව, 1965 ජනවාරි 31 වැනි දින පැරණි ගම්සභාවේ පොදු අරමුදලේ බැරට පැවති මුදලින් අඩක්, 1965 පෙබරවාරි 1 වැනි දිනදී, ඒ එක් එක් අලුත් ගම්ප්‍රදේශයේ ගම්සභාවේ පොදු අරමුදලට බැර කළ යුතුය.

(4) පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාව වෙත ඒ ප්‍රදේශයේ යම් කර්මාන්තයක් හෝ කර්මාන්ත සඳහා වෙන්කරන ලදුව, 1965 ජනවාරි 31 වැනි දින ඒ පැරණි ගම්ප්‍රදේශයේ පොදු අරමුදලේ බැරට පැවති වියදම් නොකරන ලද ආධාර මුදල්, එම කර්මාන්තය හෝ කර්මාන්ත කළ යුතුව තිබෙන්නාවූ අලුත් ගම්ප්‍රදේශයේ ගම්සභාව වෙත මාරු කළ යුතුය.

(5) 1965 ජනවාරි මස තිස්එක් වැනි දින පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරී තිබූ හෝ එහි පාලනය යටතේ පැවති මුදල් හැර වෙනත් සියළුම චංචල දේපොළ 1965 පෙබරවාරි 1 වැනි දින සිට පුතුකුඩිඉරුප්පු ගම්සභාව කෙරෙහි පවරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

(6) 1965 ජනවාරි තිස්එක් වැනි දින පැරණි ගම්ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පැවරී තිබූ හෝ එහි පාලනය යටතේ පැවති එක් එක් ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපළ 1965 පෙබරවාරි පළමුවැනි දින සිට ඒ ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපළ පිහිටි අලුත් ගම්ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පවරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

(7) පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාවේ සියලුම අයිතිවාසිකම්, ණය තුරුස්, වගකීම් හා බැඳීම්, ඒවා එක් එක් අලුත් ගම්ප්‍රදේශයට අදාළ පමණට 1965 පෙබරවාරි 1 වැනි දින සිට ඒ අලුත් ගම්ප්‍රදේශයේ ගම් සභාවට මාරු කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

(8) පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාවේ සේවයේ නියුක්තව සිටියාවූද දැන් සිටින්නාවූද සේවකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස වූ දායක මුදල් ගෙවීම පිළිබඳව ඊට ඇති වගකීම් පහත සඳහන් ආකාරයෙන් බෙදිය යුතුය :—

(අ) පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් දැනට ගෙවනු ලබන විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් පුතුකුඩිඉරුප්පු ගම්ප්‍රදේශයේ ගම්සභාව හා උතුරු කරික්කඩ්ඩුමූලෙයි ගම්ප්‍රදේශයේ ගම් සභාව අතර 1 : 1 අනුපාතයෙන්.

(ආ) පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාවේ සේවය කොට දැනට පිටතට මාරුකර ඇත්තාවූ සේවකයන්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් පුතුකුඩුඉරුප්පු ගම්ප්‍රදේශයේ ගම් සභාව හා උතුරු කරික්කඩ්ඩුමූලෙයි ගම්ප්‍රදේශයේ ගම් සභාව අතර 1 :1 අනුපාතයෙන්.

(ඇ) පැරණි ගම්ප්‍රදේශයේ ගම්සභාවේ දැනට සේවයේ නියුක්තව සිටින්නාවූ සේවකයන්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් පුතුකුඩිඉරුප්පු ගම්ප්‍රදේශයේ ගම්සභාව හා උතුරු කරික් කඩ්ඩුමූලෙයි ගම්ප්‍රදේශයේ ගම්සභාව අතර 1 : 1 අනුපාත යෙන්.

(9) මෙම උපලේඛනයෙහි—

"අළුත් ගම්ප්‍රදේශය" යනුවෙන් 1964 ජූලි 31 වෙනි දින අංක 14,126 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පල කරන ලද ආඥාවෙන් වෙනස්කර නැවත විස්තර කරනු ලැබූ පුතුකුඩිඉරුප්පු ගම් ප්‍රදේශය හෝ 1964 සැප්තැම්බර් 23 වන දින අංක 14,177 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවෙන් සංශෝධිත 1964 ජූලි 31 වන දින අංක 14,126 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවෙන් සංස්ථාපනය කරනු ලැබූ කරික්කඩ්ඩු මූලෙයි ගම්ප්‍රදේශය අදහස් වේ; තවද

"පැරණි ගම්ප්‍රදේශය" යනුවෙන් 1965 පෙබරවාරි 1 වන දිනට පෙර පැවති පුතුකුඩිඉරුප්පු ගම්ප්‍රදේශය අදහස් කෙරේ.

9–489/3—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඞී.—බී. 2/65.

## ගම්පොල මහ නගර සභාව

### මහ නගර සභා ආඥාපනත

### ආඥාව

(252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 2, 5, 6 සහ 9 වැනි වගන්ති යටතේ තමා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන කටයුතු පිළිබඳ ඇමති විසින් සම්පාදිත ආඥාවයි.

1965 සැප්තැම්බර් 1 දින,
කොළඹ දී ය.

එම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

"1965 මාර්තු 19 වැනි දින අංක 14,350 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද, ගම්පොල මහ නගර සභාවට අදාල නිවේදනයේ 6 වැනි වගන්තිය, එහි "1966 ජනවාරි 1" යන වචනය හා ඉලක්කම් වෙනුවට, "1967 ජනවාරි 1" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ."

9–526—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඞී.බී.— 47/51.
ප. පා. දෙ.—ජී. සී. 55/1/15.

## ගෝඝාතක ආඥාපනත

(272 වැනි අධිකාරය වන) ගෝඝාතක ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ නිසි බලධරයා විසින් එනම් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාගුල් බටහිර ගම්සභාව විසින් සම්පාදිතව, ඒ වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් ස්ථිර කරන ලද නියෝග.

ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 අගෝස්තු මස 25 දින,
කොළඹදීය.

### නියෝග

1. ගෝඝාතක ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ ප්‍රකාශ කරන ලද පොදු ගෝඝාතක ස්ථානය, සෞඛ්‍ය කටයුතු භාර නිලධරයාගේ හෝ සභාපති විසින් ඒ සඳහා බලය පවරන ලද යම් මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයෙකුගේ භාරයේ තිබිය යුතුය. එකී ගෝඝාතක ස්ථානය ඇතුළත මනා පරිපාලනය හා සනීපාරක්ෂක තත්වය සම්බන්ධයෙන් ඒ නිලධරයා විසින් වග කිය යුතුය.

2. (1) කිසිම තැනැත්තකු විසින් කිසිම සතෙකු—

(අ) සෞඛ්‍ය කටයුතු භාර නිලධරයා විසින් හෝ ඒ සඳහා සභාපති විසින් පත් කරන ලද නිලධරයා විසින් ඒ සතා පරීක්ෂා කොට මිනිසුන්ට ආහාර පිණිස මැරීම සුදුසු යයි අනුමත කර තිබේ නම්, මිස හෝ

(ආ) යම් දිනයක පූ.භා. 7.00 ටත් 9.00 ටත් අතර මිස, ගෝඝාතක ස්ථානයේදී නොමැරිය යුතුය. එහෙත් විශේෂ අවස්ථාවක දී මෙහි සඳහන් වේලාවට වෙනස් වූ වේලාවක යම් සතෙකු මැරීම සඳහා සභාපති විසින් බලය දිය හැකිය.

*(2) කිසිම තැනැත්තකු විසින් කිසිම සතෙකු—*

(අ) (1) වැනි ඡේදය යටතේ ඒ සතා මැරීම සඳහා අනුමත කළ වේලාවේ සිට පැය 72 කාලයක් ගතවුවාට පසු යම් වේලාවක, හෝ

(ආ) (1) වැනි ඡේදය යටතේ අනුමත කළාට පසු ඒ සතා ගෝඝාතක ස්ථානයෙන් පණ පිටින් ඉවත් කර ඇත්තේ නම් ඒ සතා නැවතත් පරීක්ෂා කොට මිනිසුන්ට ආහාර පිණිස මැරීම සුදුසු යයි එම ඡේදය යටතේ අනුමත කරන ලද්දේ නම් මිස ගෝඝාතක ස්ථානයේ දී නොමැරිය යුතුය.

3. ගෝඝාතක ස්ථානයට අයිති භූමියට යම් සතෙකු ගෙන එන සෑම තැනැත්තකු විසින් ම ඒ සතා ගෝඝාතක ස්ථානයට අයිති භූමියේ නවත්වා තබන කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම්බීම් නිසැකව ම ලැබීම සඳහා අවශ්‍ය වූ සෑම පියවරක්ම ගත යුතුයි.

4. ගෝඝාතක ස්ථානයට අයිති භූමියට යම් සතෙකු ගෙන එන සෑම තැනැත්තකු විසින් ඒ සතා මැරීමට සුදුසු නැතැයි ප්‍රතික්ෂෙප කරන ලද්දේ නම් එසේ ප්‍රතික්ෂෙප කළ වහාම ඒ සතා ඒ ස්ථානය පිහිටි භූමියෙන් ඉවත් කළ යුතුය. නැතහොත් ඉවත් කරවිය යුතුය.

5. යම් සතෙකු 2 වෙනි නියෝගය යටතේ මැරීමට සුදුසු යයි අනුමත කළාට පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ගේ ආහාර පිණිස මැරීම නුසුදුසු *බව පෙනී ගියහොත් 2 වැනි නියෝගයේ සඳහන් යම් නිලධරයකු* විසින් ඒ සතා මැරීම තහනම් කළ හැකිය.

6. ගෝඝාතක ස්ථානයේ දී මරනු ලැබූ යම් සතෙකුගේ මස් හෝ අතුනු බහන් ආදිය 2 වැනි නියෝගයේ සඳහන් වූ නිලධරයාගේ මතය අනුව ලෙඩ සහිත හෝ මිනිසුන්ගේ ආහාරයට නුසුදුසු වෙතොත් ඔහු විසින් ඒ මස හෝ අතුනු බහන් ආදිය වහාම විනාශ කර දැමීමට සැලැස්විය යුතුය. එසේ නැතහොත් ඒ මස් හෝ අතුනු බහන් ආදිය විකිණීම පිණිස තැබීම හෝ මිනිසුන් විසින් ආහාර පිණිස ගැනීම වළකින අන්දමින් ඉවත් කරවිය යුතුය.

7. ගෝඝාතක ස්ථානය භාර නිලධරයා විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස මැරීම සුදුසු යයි අනුමත කර නැත්තාවූ හෝ 5 වැනි නියෝගයේ විධිවිධාන පරිදි මැරීම තහනම් කර තිබෙන්නාවූ කිසිම සතකු මැරීමට අවසර නොදිය යුතුය.

8. (1) මිනිසුන්ගේ ආහාරයට නුසුදුසු යයි 6 වැනි නියෝගය යටතේ ප්‍රකාශ කරන ලද කිසිම මසක් හෝ අතුනු බහන් ආදියක් 2 වැනි නියෝගයෙහි සඳහන් වූ නිලධරයාගේ නියමය යටතේ මිස කිසිම තැනැත්තකු විසින් ගෝඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුයි.

(2) මිනිසුන්ගේ ආහාරය පිණිස අදහස් කරන ලද යම් සතකුගේ කුණුපය, ඒ කුණුපයේ ඉස්සරහ ගාත්වලත් පස්සා ගාත්වලත් ගෝඝාතක ස්ථානය භාර වූ නිලධරයා විසින් " මාගුල් බටහිර ග. ස. " යන සළකුණ සහ අවස්ථාවෝචිත පරිදි " ගව මස්, ඌරු මස් හෝ එළු මස් " යන වචන මුද්‍රා තබා ඇතහොත් මිස කිසිම තැනැත්තකු විසින් ගෝඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

9. වෙන යම් සතෙකු ඉදිරිපිට දී හෝ ඒ ස්ථානයේ කලින් මරන ලද යම් සතෙකුගේ කුණුපය ඉවත් කර හෝ මුවා කර, ස්ථානය ශුද්ධ පවිත්‍ර කරන තුරු හෝ කිසිම සතෙකු නොමැරිය යුතුය.

*10. වසන්ගත රෝගයකින්, සමේ රෝගයකින් හෝ බෝවෙන රෝග* යකින් පෙළෙන්නා වූ හෝ ලහදී පෙළුනා වූ හෝ එබඳු රෝගයකින් පෙළෙන කෙනෙකුට ලහදී සාත්තු කිරීමෙහි යෙදී සිටියා වූ කිසිම කෙනකුට එකී *රෝගය බෝවීමට හා රෝග බීජයන් මෝරනු* ලැබීමට ගතවන කාල සීමාවන් පසුවන තුරු යම් ගෝඝාතක ස්ථානයක් භාරව සිටින අය විසින් එකී ගෝඝාතක ස්ථානයට ඇතුල්වීමට හෝ යම් සතෙකු මැරීමේ කටයුත්තකට සහභාගිවීමට හෝ ඉඩ නොදිය යුතුය.

11. (1) මෙහි මින්මතු විධිවිධාන සලස්වනු ලබන ආකාරයට යටත්ව ගෝඝාතක ස්ථානය පාවිච්චි කිරීම සඳහා අයකළ යුතු ගාස්තුව පහත සඳහන් ප්‍රමාණයන් අනුව විය යුතුය :—

| | | රු. ශ. |
|---|---|---|
| හරකුන් සඳහා එකකුට | ... | ... 2 50 |
| බැටළුවන්, ඌරන් හෝ එළුවන් සඳහා එකකුට | | ... 1 50 |

එසේ වුවද යම් සතෙකු ගෝඝාතක ස්ථානයට ගෙන එන ලදුව මැරීම සඳහා නුසුදුසු යයි ප්‍රතික්ෂෙප කරනු ලැබූ හෝ මැරීමෙන් ඉවත් කරනු ලැබූ විට ඒ සතා සම්බන්ධයෙන් අයකළ යුතු ගාස්තුව ශත 50 ක් පමණක් විය යුතුය.

(2) (1) වැනි ඡේදය යටතේ නියමිත ගාස්තුව එකී සතා සම්බන්ධයෙන් සභාවට ගෙවා එකී ගාස්තුව ගෙවූ බවට සාක්ෂ්‍යය වශයෙන් ලබාගත් කාර්යාල කුවිතාන්සිය ගෝඝාතක ස්ථානය භාරකාරයා වෙත හෝ එකී කුවිතාන්සිය ඉදිරිපත් කර සිටිය යුත්තේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තා වශයෙන් සභාපති විසින් ලියවිල්ලකින්, පත් කළ හැකි වෙන යම් නිලධරයකු වෙත එය ඉදිරිපත් කරන තුරු ගෝඝාතක ස්ථානය තුළ සතෙකු මැරීම හෝ එම ස්ථානයෙන් සතෙකු ඉවත් කිරීම නොකළ යුතුය.

12. ගෝඝාතක ස්ථානය භාරකරු විසින්, ගෝඝාතක ස්ථානයේ මරනු ලබන—

(අ) සියලුම ගවයින්ගේ නාම ලේඛනයක් ද,

(ආ) සියලුම එළුවන්ගේ, බැටළුවන්ගේ, ඌරුන්ගේ හා හරකුන්ගේ නාම ලේඛනයක් ද තබා ගත යුතුය. ඒ නාම ලේඛනය පහත සඳහන් ආකෘතියට සාරානුකූලව විය යුතුය :—

| | | |
|---|---|---|
| | හරක් කුවිතාන්සියේ අංකය | |
| | විස්තර | |
| | පාට | |
| | වයස | |
| | දකුණු පැත්ත | හණවර |
| | වම් පැත්ත | |
| | ගෝඝාතකයාගේ නම | |
| | හරක් කොටුවකට ඇතුල්කළ වේලාව සහ දිනය | |
| | පරීක්ෂා කළ දිනය | |
| | මරණ දිනය | |
| | හරක් භාරගන්නා නිලධාරියාගේ කෙටි අත්සන | |
| | වැඩිපුර කරුණු | |

13. මේ නියෝගවල—

" සභාපති " යනුවෙන් සභාවේ සභාපති අදහස් වේ.

" සභාව " යනුවෙන් මාගුල් බටහිර ගම්සභාව අදහස් වේ. තවද,

" ආඥපනත " යනුවෙන් (272 වැනි අධිකාරය වන) ගෝඝාතක ආඥපනත අදහස් වේ.

9–509—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන පොදු ආදර්ශ (අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ කොස්ලන්ද ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

**යෝජනාව**

පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍ය වරයා විසින් සම්පාදනය කරනු ලැබ, 1963 නේ ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 සේ ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල XXXVIII වැනි කාණ්ඩය මේ යෝජනාව ගැසැට් පත්‍රයේ පළ කරවන දිනයේ සිට සම්මත කර ගැනීමට කොස්ලන්ද ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

ඒ. ඇම්. අප්පුහාමි,
සභාපති, නැත.

1965 මැයි මස 19 වැනි දින,
කොස්ලන්දේ ගම්සභා කායභීලයේදිය.

9–515—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

## 1952කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වන වගන්තිය යටතේ, මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තු උඩගම්පහ ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කර ගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර, මෙයින් ප්‍රසිඩකර සිටිනු ලැබේ.

### යෝජනාව

"පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වන දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පල කරණ ලද්දවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරණ ලද බව 1965 ජනවාරි මස 8 වන දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවු නිවේදනයෙන් ප්‍රකාශ කරණ ලද්දාවූද, පොදු අතුරු ව්‍යවස්ථාවල 38 වන කොටස මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට හාරිස්පත්තු උඩගම්පහ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වෙනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ."

එච්. ඇම්. ඩබ්ලිව්. ටිකිරි බණ්ඩා,
සභාපති,
හ. ප . උඩගම්පහ ගම්සභාව.

ගම්සභා කාර්යාලය,
අලවතුගොඩ,
1965 ජූලි 22 වැනි දින දීය.

9–502—65.9.9 දින අංක 14,501 දරණ ගැසට් පත්‍රය

---

## 1952කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ උඩුබද්දාව ගම් සභා ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මතකර ගෙන තිබෙන මෙහි පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර, මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

"පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වෙනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වෙනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දවූද, පොදු අතුරු ව්‍යවස්ථාවල XXXVIII වැනි කාණ්ඩය මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කරගැනීමට උඩුබද්දාව ගම්ප්‍රදේශයේ උඩුබද්දව ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ."

ජේ. එච්. ටිකිරිබණ්ඩා,
උඩුබද්දාව ගම්සභාවේ සභාපති තැන.

1965 ජූලි මස 23 වැනි දින,
උඩුබද්දාව ගම්සභා කායසීලයේදීය.

9–499—65.9.9 දින අංක 14,501 දරණ ගැසට් පත්‍රය

---

## හන්වැල්ල පේරුව ගම් ප්‍රදේශයේ ගම්සභාව

කොළඹ දිස්ත්‍රික්කයේ හන්වැල්ල පේරුව ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්මත කරන ලද පහත දක්වෙන යෝජනාව මහජනයාගේ දැන ගැනීම පිණිස ප්‍රසිද්ධ කරනු ලැබේ.

පී. පී. අත්තනායක,
හන්වැල්ල පේරුව ගම්සභාවේ සභාපති.

ගම්සභා කායසීලය, හන්වැල්ල,
1965 අගෝස්තු මස 30 වැනි දින දීය.

### යෝජනාව

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා පොදු අතුරු ව්‍යවස්ථා ආඥපනතේ 3 වැනි උප වගන්තිය යටතේ හන්වැල්ල පේරුව ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් 1953 නොවැම්බර් 19 වැනි දින අංක 10,614 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද යෝජනාවෙන් සම්මත කරගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා 4 වැනි කාණ්ඩයේ 1 වැනි වගන්තියේ ප්‍රකාර මෙහි පහත දක්වෙන මංමාවත් එකිනෙක ඉදිරියේ සඳහන් දිග හා පළල ඇතිව සාද හෝ නැවත සාද පවත්වා ගෙන යා යුතුයයි යෝජනා කරන ලදී.

| කොට්ඨාශයේ අංකය සහ නම | පාරේ/මාවතේ නම අංකය | දිග ද. | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|---|
| 11. ජල්තර ... | මංකඩ තොටුපල පාර ... | 3 ... | 14 ... | 8 |

9–498—65.9.9 දින අංක 14,501 දරණ ගැසට් පත්‍රය

---

## උතුරු නුවරගම් කෝරළේ ගම්සභාව

අනුරාධපුර දිස්ත්‍රික්කයේ උතුරුනුවරගම් කෝරළේ ගම්සභාව මගින් 1965.5.27 වෙනි දින රැස්වීමේදී, ගම්සභා පාරවල් සම්බන්ධව සම්මත කර ගන්නා ලද යෝජනාව මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධියට පත්කරනු ලැබේ.

ටී. බී. ජයවර්ධන,
උතුරු නුවරගම් කෝරළේ ගම්සභාවේ
ප්‍රධාන තැන.

ගම්සභා කාර්යාලය,
ඇලයාපත්තුව,
1965.6.5

### යෝජනාව

1962 අංක 6 දරණ ප්‍රදේශාධිකාරී පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා ආඥ පණතේ 3 වෙනි වගන්තිය යටතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ උතුරුනුවර ගම් කෝරළේ ගම්ප්‍රදේශයේ ගම්සභාව මගින් 1954 මැයි මස 7 වෙනි දින අංක 10,669 දරණ ලංකාණ්ඩුවේ ගැසැට් පත්‍රයේ පලකරන ලද යෝජනාවෙන් සම්මත වූ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 4වෙනි කාණ්ඩයේ 1 වෙනි ව්‍යවස්ථාවේ ප්‍රකාර මෙහි පහත උපලේඛනයේ සඳහන් මංමාවත් එකිනෙක ඉදිරියේ දක්වෙන දිග හා පළල අනුව ගම්සභාව සතුකර ගනිමින් මින්මතු සාද හෝ නැවත සාද, පවත්වාගෙන යෑම සුදුසු බවට කේ. ඒ. පීටර් සිංඤෝ හා ඇස්. ටී. ඉස්මයිල් යන සාමාජික මහතුන්ගේ, යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

### උපලේඛනය

අංක 1 ඉලන්දගහවැව කොටස

| පී. අංක | පාරේ නම | දිග ද. | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|---|
| 1. | උලුක්කුලමඇලයාපත්තුව ප්‍රසිද්ධ පාරේ සිට ඉලන්දගහ වැවට යන පාරේ කොටස ... | 42 | 14 ... | 30 |
| 2. | ඉලන්දගහවැව වෙල ලඟසිට තිබ්බටුවාගම හරහා ගොස් සියඹලාගස්වැව පාර කොටස ... | 130 | — ... | 30 |
| 3. | තිබ්බටුවාගම සිට හල්මිල්ලවැටිය දක්වා පාර කොටස ... ... | 40 | 25 ... | 30 |
| 4. | හම්මිල්ලවැටියේ සිට ඉලන්දගහවැව තිබ්බටුවාගම පාර දක්වා පාර කොටස ... | 44 | 22 ... | 30 |
| 5. | ඉලන්දගහවැව වානේ සිට මී ගහවැව දක්වා, පාර කොටස ... ... | 110 | 5 ... | 12 |
| 6. | ඉලන්දගහවැව සිට එමගම අක්කරවෙල දක්වා, පාර කොටස ... ... | 118 | 2 ... | 15 |
| 7. | ඉලන්දගහ වැව සිට මහමාන්කඩවල යාලේගම පාර දක්වා පාර කොටස ... ... | 128 | — ... | 15 |

### අංක 2 විහාර පාලුගම කොටස

| පි. අංක | පාරේ නම | දිග දු. | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|---|
| 1. | අරිප්පු පාරේ විහාර කැප්පෙටියාවේ සිට විහාර මැදවච්චිය, විහාරපාලුගම, විහාර හල්මිල්ල කුලම යන ගම් මැදින් ගොස් අනුරාධපුර පුත්තලම් පාරේ උලුක්කුලම දක්වා ඇති පාර … | 393 | 31 | 30 |
| 2. | විහාරපාලුගම පාරේ සිට ගම්මැද්ද පාර … | 20 | 45 | 12 |
| 3. | තේක්කවත්ත පාරේ සිට කිරාමැම්බර් මහතාගේ ගෙය ඉදිරියෙන් විහාරපාලුගම වැවට යන පාර | 17 | 8 | 12 |
| 4. | තේක්කවත්ත පාරේ සිට අලුත්පාසල ලඟින්, විහාරපාලුගම වැවට යන පාර … | 9 | 28 | 12 |
| 5. | තේක්කවත්ත පාරේ $1\frac{1}{2}$, කනුව ලඟසිට පුංචිකුලම දක්වා පාර කොටස … … | 61 | 2 | 15 |
| 6. | හම්මිල්ල කුලමේ සිට පුත්තලම්පාරේ, කොරකහ වැවේ, 43 කනුව දක්වා පාර… … | 118 | 2 | 30 |
| 7. | හල්මිල්ල කුලම කොරකහවැව පාරේ සිට හල් මිල්ලකුලම වැවුකන්ද දක්වා පාර කොටස … | 4 | — | 12 |
| 8. | විහාරමැදවච්චිය වානේ සිට අලුත්ගම වැවේ වාන දක්වා පාර කොටස … … | 39 | 13 | 15 |
| 9. | තේක්කවත්ත ඉලන්ද ගහවැව පාරේ සිට විහාර බුලන්කුලමේ වැව් කන්ද හරහා දඹගහවැව වාන දක්වා පාර කොටස … … | 118 | 6 | 15 |
| 10. | තේක්කවත්ත ඉලන්ද ගහ වැවපාරේ සිට විහාර කල්ලන්විය ගම මැදින් ගොස්, ගම්සභා ළිඳ ලඟින් වෙල දක්වා පාර කොටස … | 36 | 4 | 30 |
| 11. | කල්ලන්වියේ වානේ සිට මහ මාන්කඩවල, උලුක්කුලම පාර දක්වා පාර කොටස … | 66 | 22 | 15 |
| 12. | විහාර කල්ලන්වියේ සිට කුඩාගම මැදින් ගොස්, මහ මාන්කඩවල උලුක්කුලම පාර දක්වා පාර කොටස … … | 100 | 15 | 15 |

### අංක 3 මහමාන්කඩවල කොටස

| පි. අංක | පාරේ නම | දිග දු. | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|---|
| 1. | ඇලයාපත්තුව උලුක්කුලම පාරේ සිට පහළ යාලේගම පාර කොටස … … | 53 | 52 | 30 |
| 2. | ඇලයාපත්තුව උලුක්කුලම පාරේ සිට බී.ඒ. අප්පුහාමි මහතාගේ ඉඩම අයිනෙන් වැවට, යන පාර කොටස … … | 9 | 3 | 12 |
| 3. | ඇලයාපත්තුව උලුක්කුලම පාරේ සිට, පී. වන්නි හාමි මහතාගේ ඉඩම අසලින් වැවට යන පාර කොටස … … | 7 | 40 | 12 |
| 4. | ඇලයාපත්තුව උලුක්කුලම පාරේ සිට ඇම්. ඇස්. ජේදිරික් සිල්වා මහතාගේ ඉඩමටත් රජයේ ඉඩම්වලටත් අතරින් පෙරුන්කුලම වැව්කන්ද දක්වා පාර කොටස … … | 143 | 62 | 30 |
| 5. | ඇලයාපත්තුව උලුක්කුලම පාරේ මහමාන්කඩවල එච්. බී. රත්නායක මහතාගේ ඉඩම ලඟින් පටන්ගෙන කුඩා මාන්කඩවල පාරේ මහමාන් කඩවල, අක්කර වෙල දක්වා පාර කොටස … | 48 | 16 | 15 |
| 6. | ඇලයාපත්තුව උලුක්කුලම පාරේ ගම්සභා ළිඳ ලඟ සිට කොක්කිච්චිය දක්වා පාර කොටස 11 | 104 | 4 | 18 |
| 7. | උලුක්කුලම මහ මාන්කඩවල පාරේ සිට බී. අප්පු හාමි මහතාගේ සහ පී. ඩින්ගිරිබන්ඩා මහතා යන අය විසින් අල්ලාගෙන සිටින ඉඩම්වලට අතරින් යන කේ. කලුමැණිකාගේ වත්ත දක්වා පාර කොටස … … | 3 | 6 | 6 |

### අංක 4 පුසියන්කුලම කොටස

| පි. අංක | පාරේ නම | දිග දු. | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|---|
| 1. | අරිප්පු පාරේ සිට නෙල්ලිකුලම හරහා දඹගහවැව දක්වා පාර කොටස … … | 67 | 32 | 15 |
| 2. | අරිප්පු පාරේ සිට වී. වීවී උක්කුවා මහතාගේ ඉඩම අද්දරින් පුසියන්කුලම වැව් පිටිය දක්වා පාර කොටස … … | 7 | 38 | 12 |
| 3. | අරිප්පු පාරේ සිට පුසියන්කුලම වත්ත දක්වා පාර කොටස … … | 28 | 52 | 30 |
| 4. | අරිප්පුපාරේ කොක්කුච්චිය හන්දියේ සිට දිගනේ ගම, ගම් මායිම දක්වා පාර කොටස … | 64 | 28 | 30 |
| 5. | අරිප්පු පාරේ සිට මහකොක්කිච්චිය වැවේ වාන, දක්වා පාර කොටස … … | 80 | — | 30 |
| 6. | අරිප්පුපාරෙ සිට ඇඩ්වින් විජේනායක මහතාගේ සහ පී. හේරත් මහතාගේ බදු ඉඩම් දෙක අතරින් පුසියන්කුලමෙ වාන් ඇල දක්වා පාර කොටස … … | 18 | 12 | 12 |
| 7. | අරිප්පුපාරේ සිට කේ. ඒ. පීටර්සිංඤෝ මහතා ගේ සහ වින්සන් විජේනායක මහතාගේ බදු ඉඩම් අතරින් පුසියන්කුලම වාන් ඇල දක්වා පාර කොටස … … | 6 | — | 12 |
| 8. | අරිප්පුපාරේ සිට හරිස්චන්ද්‍ර මහතාගේ සහ ඇල්. එච්. තෙන්නකෝන් මහතාගේ බදුඉඩම් අත රින්, නෙල්ලිකුලම දක්වා පාර කොටස … | 15 | — | 12 |
| 9. | අරිප්පු පාරේ සිට නියිපාම් වත්ත අයිනෙන් ගොස් පුසියන්කුලම වැව දක්වා පාර කොටස … | 25 | 12 | 12 |

### අංක 5 යාලේගම කොටස

| පි. අංක | පාරේ නම | දිග දු. | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|---|
| 1. | යාලේගම දකුණු වානේ සිට ඉලන්දගහවැව ගම් මායිම දක්වා පාර කොටස … | 54 | 4 | 12 |
| 2. | යාලේගම සිට තලාවේඇල දක්වා පාර කොටස | 27 | 18 | 12 |
| 3. | යාලේගම සිට මහමාන්කඩවල ගම් මායිම දක්වා පාර කොටස … … | 51 | 34 | 30 |

### අංක 6 උලුක්කුල කොටස

| පි. අංක | පාරේ නම | දිග දු. | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|---|
| 1. | පුත්තලම් පාරේ සිට උලුක්කුලම ගම මැදින්ගොස් උලුක්කුලම පුරාණ වෙල දක්වා පාර කොටස | 28 | 52 | 30 |
| 2. | උලුක්කුලම සිට ඉදිගස්පතාන දක්වා පාර කොටස | 106 | — | 18 |
| 3. | උලුක්කුලම ඉඳගස්පතාන පාරේ සිට ඉලුප්පන් කඩවල, බෝයගොඩ මහතාගේ සහ ඇල් ජේනිස් මුදලාලි මහතාගේ කුඹුර මැදින් ගොස් නැබඩවැව ගම් මායිම දක්වා පාර කොටස … | 83 | 22 | 30 |
| 4. | උලුක්කුලම වානේ සිට ගාලේගම හරහා ඉකිරි වැව, දක්වා පාර කොටස … … | 151 | 34 | 15 |
| 5. | උලුක්කුලම පන්සල් ලඟින් ගොස් මහ බුලාන් කුලම, වැව් පිටිය දක්වා පාර කොටස … | 45 | 30 | 15 |

### අංක 7 පහලගම කොටස

| පි. අංක | පාරේ නම | දිග දු. | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|---|
| 1. | පුත්තලම්පාරේ සිට පහලගම වාන දක්වා පාර කොටස … … | 71 | 14 | 30 |
| 2. | පහලගම සිට තිබ්බටුවාගම දක්වා පාර කොටස… | 99 | 4 | 30 |
| 3. | සියඹලාගස්වැව සිට හිභුරුවාගම දක්වා පාර කොටස … … | 19 | 40 | 15 |
| 4. | පහලගම සිට මීගහ වැව දක්වා පාර කොටස … | 48 | 48 | 15 |
| 5. | පහලගම ගමේ සිට අක්කර වෙල දක්වා පාර කොටස … … | 48 | 58 | 15 |
| 6. | කුඩාගම සිට අලිග්ගම පාරේ, විජේහාමිනේ කුඹුර දක්වා පාර කොටස … … | 19 | 40 | 12 |
| 7. | පුත්තලම් පාරේ 38 කණුව ලඟ සිට ඉලන්දක් කුලම දක්වා පාර කොටස … | 19 | 40 | 30 |
| 8. | මහබුලන්කුලමේ තැපැල් කන්තෝරුව ලඟ සිට එම වැව දක්වා පාර කොටස … | 10 | 40 | 12 |
| 9. | මහබුලන්කුලමේ පුත්තලම් පාරේ සිට මහල තලාව දක්වා පාර කොටස … | 68 | 12 | 12 |
| 10. | මහබුලන්කුලම–පුත්තලම් පාරේ සිට එම වැවට යන පාර කොටස … … | 6 | 4 | 12 |
| 11. | මහබුලන්කුලම-පුත්තලම පාරේ සිට එම වැවට යන, දෙවෙනි පාර කොටස … | 6 | 14 | 12 |
| 12. | ඇලයාපත්තුව-උ ලුක්කුලම පාරේ සිට මීගහ වැවට යන පාර කොටස … … | 45 | 30 | 30 |

### අංක 8 පුවර්සන් කුලම කොටස

| පි. අංක | පාරේ නම | දිග දු. | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|---|
| 1. | පාඩියන්කඩවල විද්‍යාලය ලඟ සිට පුවරසන් කුලම, විද්‍යාලය දක්වා පාර කොටස … | 109 | 6 | 30 |
| 2. | පුවර්සන්කුලම අලුත්ගම පාරේ දිවුල්වැව, දක්වා පාර කොටස … … | 157 | 19 | 30 |
| 3. | පුවර්සන්කුලම අලුත්ගම පාරේ සිට මල්වතුඔය, දක්වා පාර කොටස … … | 80 | 30 | 12 |

### අංක 9 මානින්ගමුව කොටස

| පි. අංක | පාරේ නම | දිග දු. | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|---|
| 1. | අරිප්පු පාරේ සිට මානින්ගමුව මහ ඇහැටුවැව හරහා මල්වතුඔය දක්වා ඇති පාර කොටස … | 443 | 62 | 30 |
| 2. | මානින්ගමුව මහ ඇහැටුවැව පාරේ සිට ඉහළ ඔයා මඩුව දක්වා පාර කොටස … … | 112 | 8 | 12 |
| 3. | අරිප්පු පාරේ, $10\frac{1}{4}$ කණුව ලඟ සිට, මානින්ගමුව අක්කරවෙල දක්වා පාර කොටස … | 54 | 6 | 12 |

### අංක 10 ඇලයාපත්තුව කොටස

| සි. අංක | පාරේ නම | දිග දු. | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|---|
| 1. | අරිප්පුපාරේ සිට පෙරුන්කුලම දක්වා ඇති පාරේ පුනේරියාගම වැව දක්වා පාර කොටස | 81 | 9 | 30 |
| 2. | අරිප්පු පාරේ 7½ කණුව ලඟ සිට කුඩාමාන්කඩවල වැව දක්වා පාර කොටස | 77 | 18 | 12 |
| 3. | ඇලයාපත්තුව උලුක්කුලම පාරේ සිට නිකවැරටිය අමුණ දක්වා පාර කොටස | 42 | 14 | 12 |
| 4. | අරිප්පු පාරේ, 6½ කණුව ලඟ සිට මහකොක්කිච්චිය දක්වා පාර කොටස | 75 | 25 | 12 |
| 5. | අරිප්පුපාරේ 6යේ කණුව ලඟසිට වැලිවැවට යන පාර කොටස | 39 | 13 | 12 |
| 6. | ඇලයාපත්තුව, අරිප්පුපාරේ සිට ඇලයාපත්තුව, විදුහල ලඟින් වැව දක්වා පාර කොටස | 17 | 10 | 30 |
| 7. | ඇලයාපත්තුව මදුරුපිටිගම පාරේ සිට ඉහළ තම්මැන්නා කුලමට යන පාර කොටස | 29 | 10 | 12 |
| 8. | අරිප්පු පාරේ 7½ කණුව ලඟසිට මදුරුපිටිගම, හරහා දියනේගම දක්වා පාර කොටස | 221 | 7 | 30 |
| 9. | ඇලයාපත්තුව මදුරුපිටිගම, දිගනේගමපාරේ සිට නියන්ගම දක්වා පාර කොටස | 75 | 25 | 12 |
| 10. | මදුරුපිටිගම සිට කටුකැලියාව දබරසියඹලාව හරහා කටුගම්පලගමට යන පාර කොටස | 227 | 9 | 15 |

### අංක 11 ගල්පොත්තේගම කොටස

| සි. අංක | පාරේ නම | දිග දු. | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|---|
| 1. | දිගනේගම සිට පුසියන්කලම ගම්මායිම දක්වා පාර කොටස | 86 | 24 | 30 |
| 2. | දිගනේගම සිට පහල දිගනේගම් වාන දක්වා පාර කොටස | 68 | 12 | 15 |
| 3. | දිගනේගම සිට කරුක්කන්කුලම හරහා ගම්බිරිගස් වැව පාරට යන පාර කොටස | 175 | 25 | 30 |
| 4. | පහළ ලෝලුගස් වැව පාරේ සිට ඉහළ ලෝලුගස් වැව හරහා හීනුක්වැගමට යන පාර කොටස | 48 | 16 | 15 |
| 5. | අනුරාධපුර, ගම්බිරිගස්වැව පාරේසිට පහල ලෝලුගස් වැව හරහා තලාකොල වැව දක්වා පාර කොටස | 84 | 28 | 15 |
| 6. | අනුරාධපුර, ගම්බිරිගස්වැව පාරේ සිට පහල පලු ගස්වැව දක්වා පාර කොටස | 39 | 13 | 12 |
| 7. | අනුරාධපුර ගම්බිරිගස් වැව පාරේ සිට, ගල්පොත් තේගම ගම මැදින් ගොස් කටුගම්පලගම වාන, හරහා මහ ඇහැටුවැව දක්වා ඇති පාර කොටස | 326 | — | 30 |
| 8. | පහලගම සිට පුසියන්කුලම, දිගනේගම පාර දක්වා ඇති පාර කොටස | 75 | — | 15 |

### අංක 12 අසිරික්ගම කොටස

| සි. අංක | පාරේ නම | දිග දු. | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|---|
| 1. | අලුත්ගම අසිරික්ගම පාරේ අලියා වැටුන වැව ලඟ සිට අසිරික්ගම දක්වා පාර කොටස | 106 | 2 | 30 |
| 2. | අසිරික්ගම සිට කනදරාඔය හරහා උඩුම්බුගල දක්වා පාර කොටස | 309 | 6 | 30 |
| 3. | උඩුම්බුගල සිට මරදම්මඩුව ගම්මායිම දක්වා පාර කොටස | 57 | 9 | 30 |
| 4. | අසිරික්ගම සිට කිවුලේකඩ හරහා වන්නිය, පලු ගොල්ලාව ලඟින් ප්‍රසිද්ධ පාර දක්වා පාර කොටස | 231 | 54 | 30 |
| 5. | කටුකැලිමාවේ සිට කහ ගොල්ලෑවේ පාසල දක්වා පාර කොටස | 83 | 22 | 15 |
| 6. | අසිරික්ගම සිට සියබලා ගස්වැව, කුලුම්වාකඩ හරහා හුනුපොලයාගම දක්වා පාර කොළඹ | 215 | 5 | 15 |

### අංක 13 ගම්බිරිගස්වැව කොටස

| සි. අංක | පාරේ නම | දිග දු. | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|---|
| 1. | ගම්බිරිගස් වැව පරසන්ගහ වැව පාරේ සිට කටු කැලියාව හරහා අලුත්ගම අසිරික්ගම පාර දක්වා පාර කොටස | 72 | 8 | 15 |
| 2. | ගම්බිරිගස්වැව ප්‍රසිද්ධ පාරේ සිට තම්මැන්නාවට යන පාර කොටස | 154 | 6 | 30 |
| 3. | අලුත්ගම සිට පහිවලයාගම, හැළඹගස්වැව හරහා සියඹලාගස්වැවට යන පාර කොටස | 287 | 58 | 30 |
| 4. | කටුකැලියාවේ සිට වන්නියපලුගොල්ලෑව හන්දිය දක්වා පාර කොටස | 40 | 18 | 18 |
| 5. | පහිවලයාගම සිට මල්වතු ඔය දක්වා පාර කොටස | 75 | 25 | 12 |
| 6. | කොටියාව පාරේ සිට කොප්පැටියාව දක්වා පාර කොටස | 80 | 18 | 18 |
| 7. | ගම්බිරිගස්වැව, පාරේ සිට කුඩාතැම්මැන්නාව වාන දක්වා පාර කොටස | 78 | 26 | 12 |
| 8. | දිවුල්වැවහන්දිය සිට කුඩාතැම්මාන්නාව පාර දක්වා පාර කොටස | 54 | 6 | 12 |
| 9. | අලුත්ගම පුවර්සන්කුණලම පාරේ දිවුල්වැව දක්වා පාර කොටස | 90 | 10 | 30 |
| 10. | අලුත්ගම අසිරික්ගම පාරේ අලියා වැටුන වැව දක්වා පාර කොටස | 137 | 58 | 30 |
| 11. | ගම්බිරිස්වැව පාරේ සිට කුඩාබෙල්ලන්කඩවල, දක්වා පාර කොටස | 51 | 17 | 12 |

9–488—65.9.9 දින අංක 14,501 දරණ ගැසට් පත්‍රය

---

## 1952 කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණත

පළාත් පැලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ දළුගම සුළු නගර සභාව විසින් සම්මත කර තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

" පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1954 මාර්තු මස 26 වෙනි දින අංක 10,657 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල I සිට XVIII, XXI සිට XXIII සහ XXVI සිට XXVIII දක්වාවූ කාණ්ඩ මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට දළුගම සුළු නගර සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණතේ (261 වන පරිච්ඡේදය 3 වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ආර්. ඇස්. පෙරේරා,
දළුගම සුළු නගර සභාව,
සභාපති.

9–533—65.9.9. දින අංක 14,501 දරණ ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ සොරණාතොට ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කර තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළ කරණ ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරණ ලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරණ ලද්දාවූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට සොරණාතොට ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

කේ. වයි. ඇම්. විජේරත්න බණ්ඩා,
සභාපති තැන.

1965, ජූලි මස 24 දින,
සොරණාතොට, ගම්සභා කාර්යාලය,
දුන්හිඳ, බදුල්ල.

9–532—65.9.9 දින අංක 14,501 දරණ ගැසට් පත්‍රය

**1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණත**

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පණතේ 3 වැනි වගන්තිය යටතේ පොදු අතුරු ව්‍යවස්ථා (XXXVIII) වැනි කාණ්ඩයේ සම්මත කර ගැනීම පිළිබඳ 65.7.16 දින අංක 14,451 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිවේදනය මෙයින් අවලංගු කරමි.

ඩීනිස් විජේසිරිවර්ධන,<br>සභාපති, කැකනදුර ගම්සභාව.

ගම්සභා කාර්යාලය,<br>කැකනදුර, 65.8.16.

9-520—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

# තනතුරු—ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

1. **දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥපනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 3 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරනලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනිත් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලන ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට මාරු කර හරිනු ලැබුව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිති වාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවක යන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ 1948 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1954 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්දා ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුව ය.

(ඇ) ස්ත්‍රීන්ද, වයස 55ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සන්රින්ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4 ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක් මුදලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරු වලට පත් වන්නන්ට නියම කළ හැකිය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම්ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනකට ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු සථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

4. **නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදාල පරිදි විශ්‍රාම වැටුප් සහිත විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැත්නම් අවුරුදු 3ක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝග වලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස "නව ප්‍රවේශක නිලධාරීන්ටත්" නියම කරනු ලැබෙයි.

(iii) (අ) ස්වකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුලත දී සිංහල භාෂාව විෂයයෙහි ප්‍රවීණතාවක් ලබාගත්තා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබෙයි.

(ආ) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම අනිකුත් කරුණු අතර, නියමිත කාල සීමාවන් තුළදී සිංගලය පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමාවන් තුළදී මේ ප්‍රවීණතා පරීක්ෂණයන් ගෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමිය හැකිවන අතර, නියමිත කාල සීමා වෙන් පසු වැඩිපුර කාලසීමාවක් ඇතුලතදී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමීම, වැටුප් වැඩිවීම නතර කිරීමත් බවට පරිවර්තනය කරනු ලැබේ. එසේ නතර කිරීම පරීක්ෂණයෙන් සමත් වනතුරු බලපවත්වනු ඇත. (අංක 13,387 සහ 62.11.9 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍යභාෂා පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි බලන්න).

(ඇ) **අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.**— ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථ්‍යය අඩුම සුදුසුකම් වශයෙන් නියම කොට ඇත්තාවූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුවකුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගය කින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයකින් සාමාර්ථයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදාළ නොවේ.)

(ඈ) **කාර්යක්ෂමතා කඩයිම්.**—පත්වීම් සථිර කරන ලද දිනයේ සිට අවුරුදු 2 ක් ඇතුලතදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ සිංහල භාෂාව පිළිබඳ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණයකින් සමත් වන ලෙස නව ප්‍රවේශක නිලධාරීන්ට නියම කරනු ලැබිය හැකිය. මේ පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලය වනුයේ වැටුප් වැඩිවීම කල් දැමීමය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා ගන්නා "නව ප්‍රවේශක නිලධාරීහු" සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

(v) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී සිංහල ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණිය නොහැකි වුවහොත් අංක 21 සහ 22 දරණ පළාත් පාලන සේවා රෙගුලාසිවල සාමාන්‍ය විධිවිධාන බලපවත්වනු ඇත.

(ඉහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරන කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදෙයි.)

සටහන.—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරී" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන් ය.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. **සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවා මුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවලට නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ සභාපති මඟින් හෝ නාගරික කොමසාරිස්වරයා මඟින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාහරින්නට තමන් සූදානම් ව සිටින්ද නැත්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට සම්බන්ධ කිසිවකුට හැකි වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) **මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වූවත්** නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) අයදුම්පත් වනාහි මීට යාකොට ඇති ආකෘතියට සාරානුකූලව පිළියෙල කොට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපෑලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

**පළාත් පාලන සේවය**

**සැ. යු.**—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට ඈමිණිය යුතුය. (1) ඉංග්‍රීසි-සිංහල, දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාල වෙනම වෘත්තීය ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

———————තනතුර සඳහා වූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය : ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැදහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස :
අවුරුදු——, මාස———, දින———.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
| --- | --- | --- |
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.
(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි).

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

**සාමාන්‍ය අධ්‍යාපනය**

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
| --- | --- | --- |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

**වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය**

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම්, ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය යම් කලක නතර කරන ලද්දේ නම් එසේ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු), පළාත් පාලනායතන හා කාල සීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම් :—

සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————. (ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

